" විශිෂ්ට රාජ්‍ය සේවාවක් සඳහා අැප කැපවෙමු "

ප්‍රධාන ලේකම් කාර්යාලය - බස්නාහිර පළාත

பிரதான செயலாளர் அலுவலகம் - மேல் மாகாணம்

OFFICE OF THE CHIEF SECRETARY - WESTERN PROVINCE

204, ඩෙන්සිල් කොබ්බෑකඩුව මාවත, බත්තරමුල්ල.
204, டென்சில் கொப்பேகடுவ மாவத்தை, பத்தரமுல்ல.
204, Denzil Kobbekaduwa Mawatha, Battaramulla.

ප්‍රධාන ලේකම් / பிரதான செயலாளர் / Chief Secretary
දුරකථන / தொலைபேசி / Telephone - 011 - 2092599
ෆැක්ස් / பெக்ஸ் / Fax - 011 - 2092601
ඊ-මේල් / மின்னஞ்சல் / E-mail - chiefsecretary@wpc.gov.lk
General Telephone - 011 - 2093000

SLAB ACCREDITED ISO/IEC: 17021 QMS-001-01

මගේ අංකය / My No.	CSWP/ADM/30-38/FI/01(2025)	
ඔබේ අංකය / Your No.		
දිනය / Date	2025.04.09	

ආණ්ඩුකාර ලේකම්, ආණ්ඩුකාරවර කාර්යාලය (බ.ප)
ලේකම්, පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව (බ.ප.)
සභා ලේකම්, බස්නාහිර පළාතේ පළාත් සභා ලේකම් කාර්යාලය (බ.ප.)
ලේකම්,(පළාත් පාලන/අධ්‍යාපන/කෘෂිකර්ම/ප්‍රවාහන/සෞඛ්‍ය) අමාත්‍යාංශය (බ.ප.)
නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (පාලන/පිරිස් හා පුහුණු/මූල්‍ය/සැලසුම්/ඉංජිනේරු)
පළාත් ආදායම් කොමසාරිස් (බ.ප.)
ප්‍රධාන නීති නිලධාරි,නීති ඒකකය (බ.ප.)
අධ්‍යක්ෂ,අභ්‍යන්තර විගණන ඒකකය (බ.ප.)
ප්‍රධාන ලේකම්ගේ සම්බන්ධීකරණ ලේකම්

<u>මධ්‍යම රජයේ විවිධ අමාත්‍යාංශ වෙතින් ලැබෙන චක්‍රලේඛ (මූල්‍ය චක්‍රලේඛ හැර) බස්නාහිර පළාතට අදාල කර ගැනීමේ කමිටු තීරණ සඳහා අනුමැතිය ලබා ගැනීම.</u>

උක්ත කරුණට අදාලව පහත සඳහන් චක්‍රලේඛ හා චක්‍රලේඛ ලිපිය බස්නාහිර පළාතට අදාල කර ගැනීම සඳහා ගරු ආණ්ඩුකාරතුමා විසින් අනුමැතිය ලබා දී ඇති බව ආණ්ඩුකාර ලේකම්ගේ අංක GOS/ADM/6/2/19-2025 හා 2025.04.09 දිනැති ලිපිය මගින් මා වෙත දන්වා ඇත.

අනු අංකය	චක්‍රලේඛ / චක්‍රලේඛ ලිපි අංකය හා දිනය	විස්තරය
01.	රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 09/2025 හා 2025.04.02	රාජ්‍ය ආයතන වල ඝන අපද්‍රව්‍ය කළමනාකරණ කටයුතු විධිමත් කිරීම.
02.	අ.දූ.චෝ.වි.කො.ස. චක්‍රලේඛ 01/2025 හා 2025.03.27	2023 අංක 09 දරන දූෂණ විරෝධී පනතේ විධිවිධාන ප්‍රකාරව වත්කම් සහ බැරකම් ප්‍රකාශ කිරීම
03.	රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ ලිපි 03/2025 හා 2025.04.07	රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 10/2025 අනුව වැටුප් ගෙවීම

02. මෙම චක්‍රලේඛයන්හි හා චක්‍රලේඛ ලිපියෙහි පිටපත් ඔබගේ විද්‍යුත් තැපැල් ලිපිනයට යොමු කර ඇති අතර, එකී චක්‍රලේඛ/ චක්‍රලේඛ ලිපි පරිදි කටයුතු කරන ලෙස කාර්යාලයේ ඔබ යටතේ සිටින සියළුම දෙපාර්තමේන්තු ප්‍රධානීන්, ආයතන ප්‍රධානීන් හා නිලධාරීන් දැනුවත් කරන ලෙසත් කාරුණිකව දන්වා සිටිමි.

නදීෂා ඩී. සපරමාදු,
සහකාර ප්‍රධාන ලේකම් (පාලන),
ප්‍රධාන ලේකම් වෙනුවට,
බස්නාහිර පළාත.

දූරකථන අංකය : 011-2092608
ෆැක්ස් අංකය : 011-2092609
විද්‍යුත් ලිපිනය : cswpadm@gmail.com

අ.දූ.චෝ.වි.කො.ස.චක්‍රලේඛ අංක: 01/ 2025

අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන
කොමිෂන් සභාව,
අංක 36,
මලලසේකර මාවත,
කොළඹ 07.
2025.03.27

2023 අංක 9 දරන දූෂණ විරෝධී පනතේ 80 (1) වගන්තිය
යටතේ වත්කම් සහ බැරකම් ප්‍රකාශ කිරීමට අදාළ වන
තැනැත්තන් සහ භාරගන්නා ආයතන ප්‍රධානීන් වෙත.

<u>2023 අංක 9 දරන දූෂණ විරෝධී පනතේ විධිවිධාන ප්‍රකාරව වත්කම් සහ බැරකම් ප්‍රකාශ කිරීම</u>

2023 අංක 9 දරන දූෂණ විරෝධී පනත මඟින් ජාතික රාජ්‍ය සභාවේ 1975 අංක 1 දරන වත්කම් සහ බැරකම් ප්‍රකාශ කිරීමේ පනත ඉවත් කර ඇති අතර, දූෂණ විරෝධී පනතේ 79 වගන්තියේ සිට 92 වගන්තිය දක්වා වත්කම් සහ බැරකම් ප්‍රකාශ කිරීම සම්බන්ධ විධිවිධාන දක්වා ඇත.

2. ඒ අනුව, මධ්‍යගත ඉලෙක්ට්‍රොනික පද්ධතියක් ස්ථාපිත කර, එමඟින් වත්කම් සහ බැරකම් ප්‍රකාශ ලබා ගැනීම හා සත්‍යායනය කිරීමේ වගකීම අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාව වෙත පැවරී ඇත.

3. කොමිෂන් සභාව විසින් දැනටමත් ආරම්භ කර ඇති මෙම මධ්‍යගත ඉලෙක්ට්‍රොනික පද්ධතිය ස්ථාපනයට අදාළ මූලික වැඩකටයුතු නිම කර මධ්‍යගත ඉලෙක්ට්‍රොනික ඉදිරිපත් කිරීමේ පද්ධතිය බලාත්මකභාවයට එළඹෙන තෙක්, සංක්‍රාන්ති කාලසීමාව තුළ හෝ තාක්ෂණික දෝෂ හේතුවෙන් ඉලෙක්ට්‍රොනික පද්ධතිය අඩපණ වී ඇති සුවිශේෂී අවස්ථාවක වත්කම් සහ බැරකම් ප්‍රකාශ කිරීමේ ක්‍රියාවලිය 83(7) වගන්තිය ප්‍රකාරව අතින් ඉදිරිපත් කිරීම සඳහා කොමිෂන් සභාව විසින් අවසරය ලබා දී ඇත.

4. ප්‍රකාශකයා විසින් අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාවේ නිල වෙබ් අඩවියේ දක්වා ඇති ආකෘතියට අනුව, වත්කම් සහ බැරකම් ප්‍රකාශ අදාළ ආයතන ප්‍රධානීන් වෙත භාර දිය යුතුය.

5. එම ප්‍රකාශය අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාවේ නිල වෙබ් අඩවියේ දක්වා ඇති ඩිජිටල් ආකෘතිය පුරවා අත්සන් කරන ලද මුද්‍රිත පිටපත මඟින් ආයතන ප්‍රධානියා වෙත ලබා දීම සිදු කළ යුතුය.

6. එකී ආයතන ප්‍රධානියා විසින් එම සියලු ප්‍රකාශ අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාව වෙත යොමු කරන ලෙස මෙයින් නියම කරනු ලැබේ.

7. එකී පනතේ 80 (1) වගන්තිය යටතේ දක්වා ඇති වත්කම් සහ බැරකම් ප්‍රකාශ සිදු කළ යුතු තැනැත්තන් **ඇමුණුම II** හි **I** තීරයේ ද, අදාළ තැනැත්තන් සිය වත්කම් සහ බැරකම් ප්‍රකාශ ඉදිරිපත් කළයුත්තේ කාහට ද යන වග **ඇමුණුම II** හි **II** තීරයේ ද, ඇතුළත් කර ඇත.

8. එකී පනතේ 82 වගන්තිය අනුව **ඇමුණුම III** හි වත්කම් සහ බැරකම් ප්‍රකාශ ලබා දීමට බැඳී සිටින අවස්ථාවන් දක්වා ඇත.

9. තවදුරටත් වත්කම් සහ බැරකම් ප්‍රකාශ සම්පූර්ණ කිරීමේ **මාර්ගෝපදේශය** අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාවේ නිල වෙබ් අඩවියෙන් ඔබගේ පරිශීලනය සඳහා ලබා ගත හැක.

10. එම ප්‍රකාශ මධ්‍යම අධිකාරිය වෙත ලබා දීමේදී, ඔබ විසින් අවධානය යොමු කළ යුතු සහ ක්‍රියා කළ යුතු ආකාරය මෙම චක්‍රලේඛයට අමුණා ඇති උපදෙස් පත්‍රිකාවේ **(ඇමුණුම X)** දක්වා ඇත.

11. එහි දක්වා ඇති ආකෘතීන් වලට අදාළ තොරතුරු සම්පූර්ණ කර මෘදු පිටපත් **assets@ciaboc.gov.lk** යන විද්‍යුත් තැපැල් ලිපිනයට යොමු කර, දෘඪ පිටපත් වත්කම් සහ බැරකම් ප්‍රකාශ කොමිෂන් සභාව වෙත යොමු කිරීමේදී ඒ සමඟ එවීමට කටයුතු කළ යුතුය.

කොමිෂන් සභාවේ අණ පරිදි,

අධ්‍යක්ෂ ජනරාල්
අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාව

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

අති විශෙෂ

අංක 2428/43 - 2025 මාර්තු මස 20 වැනි බ්‍රහස්පතින්දා - 2025.03.20

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

රජයේ නිවේදන

එල්.ඩී.බී. 7/2023

2023 අංක 9 දරන දූෂණ විරෝධී පනත

2023 අංක 9 දරන දූෂණ විරෝධී පනතේ 82 වන වගන්තිය සහ 92 වන වගන්තිය සමඟ කියවිය යුතු 156 වන වගන්තිය යටතේ, අල්ලස් හෝ දූෂණ විමර්ශන කොමිෂන් සභාවේ උපදෙස් මත අධිකරණ හා ජාතික ඒකාබද්ධතා අමාත්‍යවරයා විසින් සාදනු ලබන නියෝග.

හර්ෂණ නානායක්කාර,
අධිකරණ සහ ජාතික ඒකාබද්ධතා අමාත්‍ය.

2025 මාර්තු මස 19 වැනි දින,
කොළඹ දී ය.

නියෝග

1. මේ නියෝග 2025 දූෂණ විරෝධී (වත්කම් හා බැරකම් ප්‍රකාශ) නියෝග යනුවෙන් හඳුන්වනු ලැබේ.

2. පනතේ II වන කොටස අදාළ වන සෑම තැනැත්තකුම මෙහි උපලේඛනයේ දක්වා ඇති ආකෘති පත්‍රයේ දක්වා ඇති ආකාරයට වත්කම් හා බැරකම් ප්‍රකාශ කරනු ලැබිය යුතු ය.

3. මේ නියෝගවල කාර්යය සඳහා, ශ්‍රී ලංකාව තුළ හෝ ඉන් බැහැරව, ඍජුව හෝ අර්ථදායක ලෙස හිමි වත්කම්, බැරකම්, ආදායම්, වියදම් සහ පොලී මුදල් පිළිබඳ විස්තර මෙහි උපලේඛනයේ ආකෘති පත්‍රයේ දක්වා ඇති අවශ්‍ය සහ නිශ්චය කරන ආකාරයට සපයනු ලැබිය යුතු ය.

4. මේ නියෝගවල "පනත" යන්නෙන් 2023 අංක 9 දරන දූෂණ විරෝධී පනත අදහස් වේ.

1A - PG 7060 — 354 (2025/03)

මෙම අති විශෙෂ ගැසට් පත්‍රය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.

උපලේඛනය

(2 වන නියෝගය)

ආකෘති පත්‍රය

වත්කම් සහ බැරකම් ප්‍රකාශය

(2023 අංක 9 දරන දූෂණ විරෝධී පනතේ 82 වන වගන්තිය යටතේ වන)

(1) මුලකුරු සමග නම:

(2) ප්‍රකාශ වර්ගය සහ වර්ෂය (වාර්ෂික ප්‍රකාශය/ පළමු පත්වීම් ප්‍රකාශය/ ධුර කාලය අවසානයේ දී හෝ විශ්‍රාම යාමේ දී සිදු කරනු ලබන ප්‍රකාශය/ පශ්චාත් විශ්‍රාම ප්‍රකාශය/ තත්කාර්ය ප්‍රකාශය/ මැතිවරණ ප්‍රකාශය)

(3) ඉදිරිපත් කළ දිනය:

(4) ආයතනය සහ තනතුර:

<u>ප්‍රකාශය සිදු කරන තැනැත්තාගේ පුද්ගලික තොරතුරු</u>

1. ප්‍රකාශය සිදු කරන තැනැත්තාගේ පෞද්ගලික තොරතුරු	
සම්පූර්ණ නම	
ඔබගේ නම ඔබ විසින් පසුගිය වසරේ දී වෙනස් කර ඇත්නම් කරුණාකර ඔබේ පෙර පැවති සම්පූර්ණ නම සඳහන් කරන්න	
උපන් දිනය *(දිනය/මාසය/වර්ෂය)*	
ස්ත්‍රී පුරුෂ භාරවය *(ස්ත්‍රී/පුරුෂ/වෙනත්)*	
ජාතික හැඳුනුම්පත් අංකය *(ජා.හැ.අං.)*	
විදේශ ගමන් බලපත්‍ර අංකය	
බදු ගෙවන්නා හඳුනා ගැනීමේ අංකය	
ඔබ ද්විත්ව පුරවැසිභාවය හිමි අයෙක් ද? පිළිතුර ඔව් නම්, එම රටේ විදේශ ගමන් බලපත්‍ර අංකය සඳහන් කරන්න.	
පුද්ගලික විද්‍යුත් ලිපිනය සහ සම්බන්ධ කර ගත හැකි දුරකථන අංකය/අංක *(ජංගම හා ස්ථාවර)*	
රාජකාරි විද්‍යුත් ලිපිනය සහ සම්බන්ධ කර ගත හැකි දුරකථන අංකය/ අංක *(ජංගම හා ස්ථාවර)*	
රාජකාරි ලිපිනය	
වත්මන් පදිංචිය සහිත ලිපිනය	
ස්ථිර පදිංචිය සහිත ලිපිනය	

සටහන්

(1) 2023 අංක 9 දරන දූෂණ විරෝධී පනත (මෙහි මින් මතු "පනත" යනුවෙන් හඳුන්වනු ලබන) මගින් නම් කරන ලද රජයේ තනතුරු දරන නිලධරයන්, මැතිවරණ අපේක්ෂකයින් සහ පනතේ 80 වන වගන්තියේ (1) වන උපවගන්තියේ සඳහන් කරන ලද තැනැත්තන්, ශ්‍රී ලංකාව තුළ සහ ඉන් බැහැරව පවතින ඔවුන්ගේ වත්කම් සහ බැරකම් පිළිබඳ ප්‍රකාශ කලින් කලට ඉදිරිපත් කළ යුතු ය. මෙම වත්කම් සහ බැරකම් ප්‍රකාශයට -

(අ) (මෙහි මින් මතු "ප්‍රකාශකයා" යනුවෙන් හඳුන්වනු ලබන) ප්‍රකාශය සිදු කරන තැනැත්තාගේ වත්කම් සහ බැරකම්;

(ආ) ඔහුගේ කලත්‍රයාගේ වත්කම් සහ බැරකම්;

(ඇ) ඔහුගෙන් යැපෙන එක් එක් දරුවන්ගේ වයස නොසලකා එම එක් එක් දරුවන්ගේ සියලු වත්කම් හා බැරකම්;

(ඈ) ඔවුන්ගේ වයස නොසලකා ඔහුගෙන් යැපෙන වෙනත් තැනැත්තන්ගේ සියලු වත්කම් සහ බැරකම්; *සහ*

(ඉ) ඒ තැනැත්තා පනතේ II වන කොටසට අදාළ වන තැනැත්තා සමඟ අන්‍යෝන්‍ය අයිතිවාසිකම් සහ බැඳීම් හුවමාරු කර නොගන්නා අවස්ථාවක දී හැර, ප්‍රකාශයේ දිනයට අවම වශයෙන් මාස හයකටවත් පෙරාතුව මේ කොටස අදාළ වන තැනැත්තා සමඟ පොදු නිවසක සහවාසයෙන් ජීවත්වන විට දී එකී වෙනත් යම් තැනැත්තාගේ සියලු වත්කම් සහ බැරකම්,

ඇතුළත් විය යුතු ය.

(2) (1) වන සටහනේ (අ), (ආ), (ඇ), (ඈ) සහ (ඉ) හි හඳුන්වනු ලබන තැනැත්තන්, මෙම ආකෘති පත්‍රය තුළ මින් ඉදිරියට "ආවරණය වන තැනැත්තන්" යනුවෙන් හඳුන්වනු ලැබිය යුතු ය.

(3) මෙම වත්කම් සහ බැරකම් ප්‍රකාශය, පනතේ II වන කොටසේ විධිවිධානවලට යටත්ව, පහත වගුවේ දක්වා ඇති ඕනෑම එක් හේතුවක් සඳහා ගොනු කිරීමට අවශ්‍ය වේ. කරුණාකර පහත උචිත කොටුව සලකුණු කිරීමෙන් හේතුව තහවුරු කරන්න.

(4) අදාළ වත්කම් සහ බැරකම් ප්‍රකාශ ඉදිරිපත් කිරීමට අපොහොසත් වීම, අවශ්‍ය සියලු වත්කම් සහ බැරකම් ඇතුළත් කිරීමට අපොහොසත් වීමට හෝ වත්කම් බැරකම් ප්‍රකාශ තුළ අසත්‍ය ප්‍රකාශයක් සිදු කිරීම ඇතුළුව පනතේ II වන කොටසේ අවශ්‍යතාවයන්ට අනුගත වීමට අපොහොසත් වීම, පනතේ 90 වන වගන්තිය යටතේ වරදක් වන අතර ප්‍රකාශයට ඇතුළත් කළ යුතු එහෙත් ප්‍රකාශයෙන් ඉවත් කරන ලද ඕනෑම වත්කමක් රජය සතු විය යුතු ය.

(5) ඔබ වත්කම් සහ බැරකම් ප්‍රකාශයක් ගොනු කළ යුතු තැනැත්තකු නොවේ යැයි ඔබ සිතන්නේ නම් හෝ ඔබ විසින් ප්‍රකාශය තුළ සඳහන් කළ යුත්තේ කුමන තොරතුරු ද යන්න පිළිබඳ යම් ගැටළුවක් ඇත්නම්, අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාව අමතන්න.
දුරකථන අංකය : 011 2596359; 076 7011954;
විද්‍යුත් ලිපිනය assests@ciaboc.gov.lk; වෙබ් අඩවිය: www.ciaboc.gov.lk

2. වත්කම් සහ බැරකම් ප්‍රකාශය සිදු කළ යුතු අවස්ථා			
ප්‍රකාශය ඉදිරිපත් කිරීමට හේතුව (උචිත කොටුව සලකුණු කරන්න)		**ප්‍රකාශ කළ යුතු දිනය**	
(i)	රාජ්‍ය සේවයේ පත්වීමක් ලැබීම (පළමු පත්වීම)	පත්වීම ලබා මාස තුනක් ඇතුළත	
(ii)	රාජ්‍ය නිලධාරියකු ලෙස සේවය කරන අතරතුර වාර්ෂිකව (වාර්ෂික)	සෑම වර්ෂයකම මාර්තු 31 වැනි දින	
(iii)	රාජ්‍ය සේවය හැරයාමේ දී (ධුර කාලය අවසානය)	රාජ්‍ය සේවය හැර යාමෙන් දින 14 ක් ඇතුළත	
(iv)	හිටපු රාජ්‍ය නිලධාරියකු වීම (විශ්‍රාම ගැනීමෙන් පසු)	ධුර කාලය අවසන් වීමෙන් පසු අනුගාමී වසර දෙකකින් වත්කම් සහ බැරකම් ප්‍රකාශ කිරීම	
(v)	ජනාධිපතිවරණය, පාර්ලිමේන්තු, පළාත් සභා හෝ පළාත් පාලන ආයතනයක අපේක්ෂකයකු වීම (මැතිවරණ)	නාම යෝජනා පත්‍රය ඉදිරිපත් කිරීමේ දී	
(vi)	රු. මිලියන 10ක් හෝ ඊට වැඩි වත්කම්/ බැරකම්වල වෙනසක් සිදු වීම (තත්කාර්යය)	මාසයක් ඇතුළත	

පොදු උපදෙස්:

(1) සියලු ම දිනයන් සඳහන් කිරීමේ දී දිනය/මාසය/වර්ෂය යන ආකෘතියට අනුව ද වර්ෂය ඉලක්කම් හතරක් සහිතව ද සඳහන් කළ යුතු ය.

(2) වත්කම් සඳහන් කිරීමේ දී, එය මිල දී ගැනීමක් ද, රික්තිවරණයක් ද, ත්‍යාගයක් ද හෝ වෙනත් ආකාරයකින් ලද දෙයක් ද යන්න පිළිබඳව සඳහන් කරන්න. වෙනත් ආකාරයකින් අත්පත් කර ගත් දෙයක් නම් ඒ කෙසේ ද යන්න පැහැදිලි කරන්න. ප්‍රසිද්ධියේ වෙළෙඳාම් කරන ලද සුරැකුම්පත් හැර, මිල දී ගත් අනෙත් සියලු වත්කම් මිල දී ගත් මුදල සඳහන් කර, ප්‍රකාශය ඉදිරිපත් කරන අවස්ථාව වන විට ඒවායේ වටිනාකම පිළිබඳ සද්භාවීය ඇස්තමේන්තු අගයක් සඳහන් කරන්න.

(3) ආවරණය වන තැනැත්තකු විසින් දරනු ලබන වත්කම් සඳහන් කිරීමේ දී, ශ්‍රී ලංකාවේ හෝ විදේශයන් හි දරනු ලැබූ වත්කම් ඇතුළත් කරන්න. හිමිකම සඳහන් කිරීමේ දී ආවරණය වන පුද්ගලයාගේ නමින් නීත්‍යනුකූලව හිමිකම් කියන හෝ ලියාපදිංචි කර ඇති ඕනෑම වත්කමක් පමණක් නොව, හවුල් හිමිකාරිත්වය හෝ භුක්තිය ඇතුළුව ප්‍රකාශකයාට ප්‍රතිලාභයක් හෝ භාවිතයක් ඇති ඕනෑම දේපළක් ඇතුළත් කරන්න. උදාහරණයක් ලෙස, ආවරණය වන තැනැත්තා විසින් සැලකිය යුතු කාලයක් පදවන මෝටර් රථයක් හෝ ආවරණය වන තැනැත්තා සැලකිය යුතු කාලයක් ගත කරන නිවසක් හෝ බද්ධ නිවසක් දැක්විය හැකි ය.

<u>ආවරණය වන තැනැත්තන්ගේ වත්කම් සහ බැරකම් පිළිබඳ විස්තර</u>

1. ප්‍රකාශකයාට අමතරව ආවරණය වන තැනැත්තන් පිළිබඳ තොරතුරු

ආවරණය වන තැනැත්තාගේ වාසගම සහ වෙනත් නම්	උපන් දිනය	ජාතිය	ආදායම් බදු අංකය	ජාතික හැඳුනුම්පත් අංකය (ජා.හැ.අං)	විදේශ ගමන් බලපත්‍රය	වර්තමාන ලිපිනය	ස්ථිර ලිපිනය

2. ආවරණය වන තැනැත්තන් විසින් දරනු ලැබූ නිශ්චල දේපළ

ආවරණය වන තැනැත්තා	වර්ගය*	වර්ගඵලය/ අවකාශය (වර්ග අඩි/අක්කර/ පර්චස්)	ලිපිනය	අත්කරගත් දිනය, අත්කරගත් අයිතිවාසිකම් (අයිතිය, බද්ද හෝ වෙනත් භාවිත කිරීමේ හෝ භුක්ති විඳීමේ අයිතිය) ඉඩම් රෙජිස්ට්‍රාර් කාර්යාලයේ අංකය	අත්පත්කරගත් ආකාරය (තෑගි හෝ මිලදී ගැනීම ආදී)	වටිනාකම	සම අයිතිකරු-වකුගේ හෝ දේපළෙහි අයිතිවාසිකම් ඇති වෙනත් නෛතික හෝ ස්වභාවික තැනැත්තකුගේ නම

* (1) ඉඩම් කට්ටිය; (2) නේවාසික ගොඩනැගිල්ල; (3) බද්ධ නිවාස; (4) කාර්යයාලය; (5) වාණිජ ගොඩනැගිල්ල; (6) ගරාජය; (7) ගබඩාව; (8) වෙනත් (නිශ්චිතව සඳහන් කරන්න.)

3. **චංචල දේපළ**

ප්‍රකාශයට පත්කළ යුතු දේපළ: රුපියල් ලක්ෂ පහක් (රු. 500,000.00) ඉක්මවන වටිනාකමකින් යුතු චංචල දේපළ. චංචල දේපළ යන්නෙන්, ආරක්ෂක තැන්පතු සේප්පු (හඳුනාගැනීමේ අංකය) ඇතුළුව හානිවීමකින් තොරව ගෙන යා හැකි යම් ද්‍රව්‍යවමය අයිතිමයක් අදහස් වේ.

ප්‍රකාශයේ මේ කොටස තුළ පහත දැක්වෙන දේපළ ප්‍රකාශයට පත් නොකළ යුතු යː-

සුරැකුම්පත්; ආයතනික අයිතිවාසිකම්; මුදල්; බැංකු සහ වෙනත් මුල්‍ය ආයතනවල ගිණුම්වල ඇති මුදල්; (බැංකුවක වන) වටිනා ලෝහ සහ මුදල් ආකාරයෙන් ලද ත්‍යාග

ආවරණය වන තැනැත්තා	වර්ගය	බර සහ/හෝ ප්‍රමාණය	ලක්ෂණ		අත්කර ගත් දිනය සහ අත්කර ගත් ආකාරය	වටිනාකම	(දේපළට සම අයිතිය ඇත්නම්) සම අයිතිකරු-වන්ගේ තොරතුරු එක් එක් සම අයිතිකරුට අයිති ප්‍රතිශතය ඇතුළත් කරන්න (ස්වභාවික තැනැත්තා හෝ නෛතික තැනැත්තා)	(සන්තකයේ තබා ගැනීමේ හෝ පාවිච්චි කිරීමේ අයිතිය යටතේ දේපළ අත්කරගෙන ඇත්නම්) දේපළෙහි අයිතිකරු පිළිබඳ තොරතුරු (ස්වභාවික තැනැත්තා හෝ නෛතික තැනැත්තා)
			අයිතියේ වර්ගය	වෙළඳ ලකුණ හෝ නිෂ්පාදකයාගේ නම				

* (1) පෞරාණික භාණ්ඩ; (2) සිතුවම්; (3) රන්, රිදී, ප්ලැටිනම් හෝ වෙනත් යම් වටිනා ලෝහ; (4) ඔරලෝසු; (5) වෙනත් ස්වර්ණාභරණ (නිශ්චිතව සඳහන් කරන්න; (6) මුද්දර එකතු; (7) කාසි සහ; (8) රුපියල් දෙලක්ෂ පනස් දහස නොඉක්මවන වටිනාකමකින් යුතු (රු. 250,000.00) මැණික්, දියමන්ති හෝ වෙනත් යම් වටිනා පාෂාණ මෙම කොටස යටතේ ප්‍රකාශයට පත්කළ යුතු ය.

4. **චංචල දේපළ - වාහන**

ප්‍රකාශයට පත්කළ යුතු දේපළ: වටිනාකම කුමක් වුව ද වාහන සහ වෙනත් ස්වයං-චලිත යන්ත්‍ර සහ යාන්ත්‍රණ

ආවරණය වන තැනැත්තා	වර්ගය*	අයිතියේ වර්ගයේ	නිෂ්පාදිත රට සහ මාදිලිය (වෙළඳ ලකුණ)	එන්ජිමෙහි සිලින්ඩර ධාරිතාව (සීසී)	නිෂ්පාදිත වර්ෂය	(අදාළ වේ නම්) හඳුනා ගැනීමේ අංකය	අත්කරගත් දිනය	වටිනාකම	(දේපළට සම-අයිතිය ඇත්නම්) සම අයිතිකරු-වන් පිළිබඳ තොරතුරු එක් එක් සම අයිතිකරුට අයිති ප්‍රතිශතය (ස්වභාවික තැනැත්තා හෝ නෛතික තැනැත්තා)	(සන්තකයේ තබා ගැනීමේ හෝ පාවිච්චි කිරීමේ අයිතිය යටතේ දේපළ අත්කරගෙන ඇත්නම්) දේපළෙහි අයිතිකරු පිළිබඳ තොරතුරු (ස්වභාවික තැනැත්තා හෝ නෛතික තැනැත්තා)

* (1) යතුරුපැදි; (2) මෝටර් ට්‍රයිසිකල්; (3) මෝටර් කාර්; (4) ද්විත්ව කාර්යය වාහන; (5) ඉඩම් වාහන; (6) මෝටර් ලොරි; (7) බස් රථ; (8) ට්‍රේලර් සහ බවුසර්; (9) විශේෂ කාර්යය වාහන; (10) ලොරි ට්‍රේලර්; (11) ප්‍රයිම් මුවර්ස්; (12) ගිලන් රථ; (13) කොඩ්‍රිසයිකල්; (14) ට්‍රැක්ටර්ස්; (15) අවමංගල රථ; (16) වෙනත් විශේෂ කාර්යය වාහන; (17) මෝටර් නිවහන; (18) කෘෂිකාර්මික යන්ත්‍ර; (19) ජලයේ ගමන් කරන වාහන; (20) ගුවනේ ගමන් කරන වාහන; (21) වෙනත් (නිශ්චිතව සඳහන් කරන්න)

5. **සුරැකුම්පත්**

ආවරණය වන තැනැත්තා	වර්ගය*	අයිතියේ වර්ගය	සුරැකුම්පත නිකුත් කරන්නා (ස්වභාවික තැනැත්තා හෝ නෛතික තැනැත්තා)	අත්කරගත් දිනය සහ අත්කරගත් ආකාරය	වටිනාකම (ප්‍රසිද්ධියේ අලෙවි කළ සුරැකුම්පත් සඳහා මෙය ගොනු කිරීමට පෙරාතුව වූ දිනයේ වූ අවසන් මිල අලෙවි නොකළ මිල දී ගත් සුරැකුම්පත් සඳහා ගෙවූ මිල රික්තවරණ ත්‍යාග හෝ මෙය ගොනු කරනු ලබන අවස්ථාවක දී වන සද්භාවයෙන් සිදුකරන ලද වෙනත් යම් ඇස්තමේන්තු කරන්න)	සුරැකුම්පත් ප්‍රමාණය	කළමනාක-රණය කිරීම සඳහා සුරැකුම්පත් පවරන ලද තැනැත්තා පිළිබඳ තොරතුරු (ස්වභාවික තැනැත්තා හෝ නෛතික තැනැත්තා)

* සුරැකුම්පතක් යනු රාජ්‍ය සහ පෞද්ගලික වෙළඳපොළවල්හි ප්‍රාග්ධනය ඉහළ නැංවීම සඳහා භාවිත කරනු ලබන ප්‍රතිමෝජනය කළ හැකි මූල්‍යමය සාධන පත්‍රයකි.

(1) කොටස්; (2) ණය සුරැකුම්පත්; (3) සාංගමික බැඳුම්කර; (4) මහ බැංකු බැඳුම්කර; (5) භාණ්ඩාගාර බැඳුම්කර; (6) බදු සංචිත සහතිකපත්; (7) බැඳීම්; (8) ඉතිරි කිරීමේ (තැන්පතු) සහතික; (9) පොරොන්දු නෝට්ටු; (10) ජාත්‍යන්තර මූල්‍ය ආයතනවල බැඳුම්කර; (11) විදේශීය රජයන්ගේ බැඳුම්කර; (12) ස්වභාවික තැනැත්තන්ගේ බැංකු තැන්පතු අරමුදලේ බැඳුම්කර; (13) චෙක්පත්; (14) ආයෝජන සහතික; (15) උකස් සුරැකුම්පත්; (16) උකස් බැඳුම්කර; (17) උකස් සහතික; (18) උකස් ඇපකර; (19) ව්‍යුත්පන්න; (20) පුද්ගලකරණය කළ සුරැකුම්පත් (වවුචර ආදිය); (21) භාණ්ඩවල හිමිකම් ලේඛන; (22) වෙනත් වර්ගය (නිශ්චිතව සඳහන් කරන්න)

6. **සාංගමික හිමිකම්**

ප්‍රකාශයට පත්කළ යුතු දේ: ඉහත "5. සුරැකුම්පත්" ශීර්ෂය යටතේ වන වගුවේ සඳහන් කර ඇති සුරැකුම්පත්වලට අමතරව සීමිත හෝ පොදු හවුල්කාරීත්වයන්හි හෝ ණය දෙන සමිතිවල කොටස් ද ඇතුළුව සහ යම් කොටස් හිමිකම් ද ඇතුළුව ශ්‍රී ලංකාවේ හෝ විදේශ රටක ලියාපදිංචි කරන ලද නෛතික ආස්ථිත්‍යවල ව්‍යවස්ථාපිත ප්‍රාග්ධනයට සමාන වෙනත් යමක්.

ආවරණය වන තැනැත්තා	ප්‍රකාශකට කොටස් අයත් කොටස් සහ ආස්ථිත්‍යයේ නම	ආස්ථිත්‍යයේ ප්‍රධාන කාර්යයාලය ලියාපදිංචි රට	ආස්ථිත්‍යයේ සංවිධානාත්මක සහ නෛතික ආකෘතිය	ලියාපදිංචි කිරීමේ විස්තර	අයිතියේ වර්ගය	ප්‍රාග්ධනය හෝ එයට සම වූවක නෛතික පුද්ගලයාට හිමි කොටස		
						මූල්‍යමය පදනමින් (වටිනාකම)		ප්‍රතිශතයක් ලෙස (%)
						සමස්ත	පසුගිය වර්ෂයේ දී අත්පත් කර ගැනීම	

7. **ස්පර්ශ කළ නොහැකි වත්කම් හා බලපත්‍ර**

ස්පර්ශ කළ නොහැකි වත්කම් යටතට බුද්ධිමය දේපළ අයිතිය (නව නිපැයුම්, ප්‍රයෝජනවත් ආකෘති, දැනුම, කාර්මික සැලසුම් හෝ නව ශාක ප්‍රභේද, වෙළඳ ලකුණ හෝ වෙළඳ නාමය, ප්‍රකාශන අයිතිය, පේටන්ට් බලපත්‍ර යනාදිය සඳහා ඇති හිමිකම), යටිපස හා වෙනත් ස්වභාවික සම්පත් ප්‍රයෝජනයට ගැනීම සඳහා ඇති අයිතිය හෝ වෙනත් යමක් (නිශ්චිතව සඳහන් කරන්න) අයත් වේ.

ආවරණය වන තැනැත්තා	වර්ගය (බුද්ධිමය දේපළ හිමිකම (වර්ගය නිශ්චිතව සඳහන් කරන්න) යටිපස හා වෙනත් ස්වභාවික සම්පත් ප්‍රයෝජනයට ගැනීම සඳහා අයිතිය/ වෙනත් (නිශ්චිත සඳහන් කරන්න)	අයිතිවාසිකමේ අරමුණ පිළිබඳ විස්තරය (වත්කම සඳහා හිමිකම සහතික කරන නිල ලියවිල්ලට අනුව - අදාළ වේ නම් එම නිල ලියවිල්ලේ පෙළ සහ අංකය සඳහන් කරන්න)	හිමිකම් වර්ගය	අත්කර ගත් දිනය	අත්කරගත් ආකාරය	වටිනාකම

8. ආදායම

8.1 ත්‍යාග හැර වෙනත් ආදායම්

ආවරණය වන තැනැත්තා	ආදායම් වර්ගය*	හිමිකම් වර්ගය	ආදායම් මූලාශ්‍රය (ස්වභාවික තැනැත්තා හෝ නෛතික තැනැත්තා)	පූර්ව ලිත් වර්ෂයේ දී ඉපයූ මුදල් ප්‍රමාණය

* ආදායම් යන්නෙන්, 2017 අංක 24 දරන දේශීය ආදායම් පනතේ 4, 5, 6, 7 සහ 8 වන වගන්තිවල නිශ්චිතව දක්වා ඇති තක්සේරු කළහැකි ආදායම අදහස් වන අතර, ඊට, (1) වැටුප (දිරි දීමනා සහ වන්දි ගෙවීම් ඇතුළත් මූල්‍යමය දීමනා; (2) ගරු දීමනා හෝ ගිවිසුම්වලට අනුව සිදුකරන වෙනත් ගෙවීම්; (3) ව්‍යවසායක කටයුතුවලින් ලැබෙන ආදායම; (4) ස්වාධීන වෘත්තීමය කටයුතුවලින් ලැබෙන ආදායම (නිශ්චිතව සඳහන් කරන්න); (5) ඉඩකඩම් විකිණීමෙන් ලැබෙන ආදායම (සුරැකුම් හැර); (6) චංචල දේපළ විකිණීමෙන් ලැබෙන ආදායම; (7) දේපළ බදු දීමෙන් ලැබෙන ආදායම; (8) ලාභාංශ; (9) පොළිය; (10) කතෘ භාග; (11) රක්ෂණ ගෙවීම්; (12) පුණ්‍යාධාර; (13) විශ්‍රාම වැටුප; (14) උරුමයෙන් ලැබෙන ආදායම; (15) සුරැකුම්පත් සහ කොටස් විකිණීමෙන් ලැබෙන ආදායම(වර්ගය නිශ්චිතව සඳහන් කරන්න) ; (16) අනුග්‍රාහිත සංචාර සහ සේවාවලින් ලැබෙන ආදායම්; (17) වාහන; (18) ශිෂ්‍යත්ව; (19) වෙනත් ආදායම් (නිශ්චිතව සඳහන් කරන්න); (20) රාජ්‍ය ආස්ථිත්‍ය සමග ඇතිකරගත් ගිවිසුම්, ආදිය නිදර්ශන ලෙස දැක්විය හැකි නමුත් ඒවාට සීමා නොවන ආදායම් ඇතුළත් වේ.

8.1 ත්‍යාග ඇතුළු සංචාර ප්‍රතිපූරණයන්

ඉහත සඳහන් කර තිබුණ ද, පවුලේ සමීපතම සාමාජිකයකු නොවන යම් තැනැත්තකගෙන් හෝ ආයතනයකින් පසුගිය වර්ෂයේ දී සමස්ත අගය රුපියල් පනස්දහසක් (රු. 50,000.00) ඉක්මවා එක් තනි මූලාශ්‍රයකින් ලද සංචාර ප්‍රතිපූරණ ඇතුළු යම් ත්‍යාග ලැයිස්තුගත කරන්න.

ලබන්නා	ත්‍යාගය පිළිබඳ විස්තරය	ලද දිනය	කවරකුගෙන්ද යන වග	වටිනාකම පිළිබඳ සද්භාවීය ඇස්තමේන්තුව

9. මූල්‍යමය වත්කම්

ප්‍රකාශයට පත්කළ යුතු වත්කම්: මුදල්, ඩිජිටල් ව්‍යවහාර මුදල්, බැංකු ගිණුම්වල ඇති අරමුදල්, ණය දෙන සමිති සහ අන්‍යොන්‍ය ආයෝජන ආයතන ඇතුළු බැංකු නොවන මූල්‍යමය ආයතනවලට සිදුකර ඇති දායකත්ව මුදල්, තුන්වන පාර්ශවය සඳහා ලබා දී ඇති ණය ; වටිනා ලෝහ ආකාරයෙන් ඇති වත්කම් (බැංකුවල පවතින) සහ වෙනත්6 නිශ්චිතව සඳහන් කරන්න).

ආවරණය වන තැනැත්තා	වර්ගය*	අයිතිවාසිකමේ වර්ගය	මුදල් ප්‍රමාණය	ව්‍යවහාර මුදල්	අදාළ ගිණුම විවෘත කර ඇති හෝ මුදල් තැන්පත් කරනු ලබන ආස්ථිත්‍ය ශ්‍රී ලංකාවේ හෝ විදේශ ආස්ථිත්‍යයක ලියාපදිංචි වූ තැනැත්තකු	මුදල් ණයට දෙනු ලැබ ඇති තැනැත්තා හෝ ආස්ථිත්‍යය

* (1) මුදල්; (2) ඩිජිටල් ව්‍යවහාර මුදල්; (3) බැංකු ගිණුම්වල ඇති අරමුදල් (ගිණුම් අංකය සඳහන් කරන්න); (4) ආනොන්‍යන්‍ය ආයෝජන ආයතන ඇතුළු ණය දෙන සමිති සහ බැංකු නොවන මූල්‍යමය ආයතනවලට සිදු කර ඇති දායකත්ව මුදල් (ආයතනයේ වර්ගය සහ ගිණුම් අංකය සඳහන් කරන්න); (5) තෙවන පාර්ශ්වවලට ණයට ලබා දී ඇති මුදල්; (6) වටිනා ලෝහ ආකාරයෙන් ඇති වත්කම්; (7) වෙනත් (නිශ්චිතව සඳහන් කරන්න)

10. මූල්‍ය බැඳීම්

බැඳීම් වටිනාකමෙහි සමස්ත අගය රුපියල් ලක්ෂ පහ (රු. 500,000.00) ඉක්මවන්නේ නම් සඳහන් කරන්න.

ආවරණය වන තැනැත්තා	අයිතමය	වර්ගය*	මුදල් ප්‍රමාණය	මුදල් වර්ගය	බැඳීම ඇති වූ තැනැත්තා (ස්වභාවික තැනැත්තා හෝ නෛතික තැනැත්තා	බැඳීම ඇති වූ දිනය	පියවිය යුතු දිනය	බැඳීම සඳහා සිටින ඇපකරුවන් පිළිබඳ තොරතුරු (ඇපකරුවෙක් මගින් බැඳීම සුරක්ෂිත කර ඇත්නම්)

* (1) ලැබූ ණය මුදල්; (2) ලැබූ ණය; (3) කල්බදු ගිවිසුම් යටතේ වන බැඳීම්; (4) මූලික ණය මුදලේ කොටස වශයෙන් ගෙවන මුදල් ප්‍රමාණය; (5) ණය මුදලේ පොලිය සඳහා ගෙවන ලද මුදල් ප්‍රමාණය/රක්ෂණ ගිවිසුම යටතේ වූ බැඳීම්; (6) රාජ්‍ය නොවන විශ්‍රාම වැටුප් ලබාදීමේ ගිවිසුම යටතේ වන බැඳීම; (7) වෙනත් තැනැත්තන් විසින් ප්‍රකාශක වෙත ණයට ලබා දුන් මුදල; (8) වෙනත් තැනැත්තන් විසින් ප්‍රකාශක නොවන ආවරණය වන තැනැත්තන් වෙත ලබා දෙන ලද මුදල්; (9) හිඟ බදු මුදල්; (10) වෙනත් (නිශ්චිතව සඳහන් කරන්න)

11. **වෙනත් ගණුදෙනු (ඉහත ශීර්ෂ යටතේ වන වගුවලින් ආවරණය නොවූ)**

ආවරණය වන තැනැත්තා	ගනුදෙනු වර්ගය*	ගනුදෙනුවේ අරමුණ**	ගනුදෙනුවේ අනෙක් පාර්ශ්වය පිළිබඳ තොරතුරු

* ආවරණය වන තැනැත්තාගේ හිමිකම් අයිතිවාසිකම් මගින් ලබා ගැනීමෙන් ජනිත වූ ගනුදෙනුව (හවුල් හිමිකම ද ඇතුළුව); සන්තකය හෝ භුක්තිය ලබා ගැනීමේ දී සිදු වූ ගනුදෙනුව/ ප්‍රකාශකගේ හිමිකම් අයිතිවාසිකම, සන්තකය හෝ භාවිතය අවසාන වීම/ ආවරණය වන තැනැත්තාගේ මූල්‍යමය බැඳීම (නිශ්චිතව දක්වන්න)

** (1) දේපළ ඉඩකඩම්; (2) ඉඩම් කට්ටිය; (3) නේවාසික ගොඩනැගිලි; (4) බද්ධ නිවාස; (5) වාණිජ ගොඩනැගිලි; (6) ගරාජය; (7) වෙනත් දේපොළ(නිශ්චිතව සඳහන් කරන්න); (8) චංචල දේපොළ; (9) වාහන; (10) සුරැකුම්පත්; (11) මූල්‍යමය වත්කම්; (12) ආභරණ; (13) පුද්ගල සහ ගෘහ විදුලි උපකරණ; (14) ඇඳුම්; (15) පශු සම්පත්; (16) රන්, රිදී, ප්ලැටිනම් හෝ වෙනත් යම් වටිනා ලෝහ; (17) පෞරාණික භාණ්ඩ; (18) සිතුවම්; (19) වෙනත් දේපළ (නිශ්චිතව සඳහන් කරන්න); (20) ස්පර්ශ කල නොහැකි වත්කම් (නිශ්චිතව දක්වන්න); (21) සංචාරක (පවුලේ සියලු සාමාජිකයන්ගේ මුළු සංඛ්‍යාව; (22) අධ්‍යාපනය (පෞද්ගලික පාසල් හෝ විශ්ව විද්‍යාල); (23) විනෝදාස්වාදය.

12. ආවරණය වන තැනැත්තා රජයේ හෝ පෞද්ගලික ආයතනයක හෝ ඒවායේ පාලක මණ්ඩලවල දරන තනතුරු හෝ සාමාජිකත්වයන්

ප්‍රකාශයට පත් කළ යුතු දේ: ප්‍රජා සමාගම්, පුණ්‍යායතන, ස්වයං-නියාමක හෝ ස්වයං-පාලක වෘත්තීමය සංවිධානයන්හි කළමනාකරණ, විගණන හෝ අධීක්ෂණ මණ්ඩලයක සාමාජිකයකු වශයෙන් ආවරණය වන තැනැත්තා සහභාගිවීම සහ එවැනි සමාගම් (සංවිධාන) වල දරනු ලබන සාමාජිකත්වය.

යම් කාලසීමාවක් සඳහා වාර්තා කරන කාල පරිච්ඡේදය අතරතුරදී ආවරණය වන තැනැත්තා එම සංවිධානයේ විශේෂිත තනතුරක් දැරුවේ නම් හෝ සාමාජිකයකු වී සිටියේ නම් පහත දැක්වෙන තොරතුරු සඳහන් කල යුතු ය.

ආවරණය වන තැනැත්තා	සංවිධානයේ/ මණ්ඩලයේ නම	නෛතික හා සංවිධානමය ස්වභාවය*	ලියාපදිංචිය පිළිබඳ විස්තර

* (1) ප්‍රජා සමාගම්; (2) පුණ්‍යායතන; (3) ස්වයං නියාමක හෝ ස්වයං-පාලක වෘත්තීමය සංවිධාන; (4) භාරකාර මණ්ඩල හා පදනම්; (5) පුද්ගලික අංශය හෝ රාජ්‍ය අංශය විසින් හිමිකාරීත්වය දරන ව්‍යාපාර; (6) පොදු හෝ සීමිත හවුල් ව්‍යාපාර; (7) වෙනත් යම් වර්ගයක නෛතික තැනැත්තන් (නිශ්චිතව සඳහන් කරන්න)

13. භාරයන්

භාරයක, ඒ හා සමාන නෛතික ආස්ථිත්‍යයක හෝ ගිවිසුම්ගත විධිවිධානයකින් ආවරණය වන තැනැත්තා සඳහා යම් පුද්ගයකු හෝ ආස්ථිත්‍යයක් යම් වත්කමක් තබා ගන්නේ ද? එසේ නම් ඒ භාරය, ආස්ථිත්‍ය හෝ ගිවිසුම්ගත විධිවිධාන ස්ථාපිත කරන සියලු ලේඛනවල පිටපතක් ලබා දී ලේඛනයේ සඳහන් පරිදි පහත තොරතුරු ලැයිස්තුගත කරන්න :-

භාරකරුගේ නම/ සම්බන්ධ කර ගැනීමේ තොරතුරු (ලිපිනය, දුරකථන අංකය ආදිය)	වත්කම්	භාර කතෘගේ නම/ සම්බන්ධ කර ගැනීමේ තොරතුරු	ප්‍රතිලාභීන් සියල්ලන්ගේ නම්	භාරය ආරක්ෂා කරන්නා/කරන්න-න්ගේ බලාත්මක කරන්නා/ කරන්නන්ගේ හෝ භාරකරු කෙරෙහි බලය ඇති වෙනත් තෙවන පාර්ශ්වයන්ගේ	අදාළ වන නීතිය

ආවරණය වන යම් තැනැත්තකු වෙනත් යම් තැනැත්තකු වෙනුවෙන් යම් දේපළක භාරකාරත්වය දරන්නේ ද? එසේ නම්, ඊට අදාළව ඉහත ඉල්ලා ඇති තොරතුරු සපයන්න.

දිවුරුම/ප්‍රතිඥාව

.... වන මම මෙහි සපයා ඇති පිළිතුරු සහ සිදු කර ඇති ප්‍රකාශ සත්‍ය හා නිවැරදි බවත්, වෙනත් පාර්ශ්වයක කිසිදු බලපෑමකින් හෝ බල කිරීමකින් තොරව, මෙම වත්කම් සහ බැරකම් ප්‍රකාශ කිරීම සත්‍යවාදී ලෙස සිදු කළ බවත්, ගෞරව බහුමානයෙන් යුක්තව, අවංකව හා සත්‍ය ලෙස ප්‍රකාශ කර ප්‍රතිඥා දෙමි/ දිවුරුම් දෙමි.

ප්‍රකාශ නොකළ වත්කම් සහ/හෝ සාවද්‍ය ප්‍රකාශ පිළිබඳව අනාවරණය වුවහොත්, එහි නෛතික ප්‍රතිවිපාක පිළිබඳ මා මැනවින් දැනුවත්ව සිටිමි.

20.................. වර්ෂයේ .... මස .... දින මා ඉදිරිපිට දිවුරුම්/ ප්‍රතිඥා දෙන ලදී.

දිවුරුම් කොමසාරිස්/ සාමදාන විනිශ්වයකාර

විස්තරාත්මක සටහන්

(1) ඉල්ලා ඇති තොරතුරු සඳහන් කිරීම සඳහා මෙම ආකෘති පත්‍රයේ යම් තීරුවක ඉඩකඩ ප්‍රමාණවත් නොවන්නේ නම්, එම තොරතුරු වෙනම උපලේඛනයක හෝ උපලේඛනවල දැක්විය හැකි අතර, එහි ප්‍රතිඵලයක් වශයෙන් ඊට ඇඳෙන ඕනෑම උපලේඛනයක් සඳහා සුදුසු මූලාශ්‍ර දැක්වීම සිදු කරනු ලැබිය යුතු ය. එම උපලේඛන ඔබ විසින් ද අත්සන් කළ යුතුය.

(2) මෙම ආකෘති පත්‍රයේ ඕනෑම කොටසක් තුල සටහන් කිරීමට තොරතුරු කිසිවක් නොමැති නම්, අදාළ ඉඩකඩ තුළ කරුණාකර "කිසිවක් නැත" යනුවෙන් ලියන්න.

(3) වැඩිදුර පැහැදිලි කර ගැනීමේ කාර්යය සඳහා කරුණාකර 2023 අංක 9 දරන දූෂණ විරෝධී පනතේ II වන කොටස බලන්න.

EOG 03 - 0181

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

<u>වත්කම් සහ බැරකම් ප්‍රකාශය සම්පූර්ණ කිරීම සඳහා වන මාර්ගෝපදේශය</u>

මෙම මාර්ගෝපදේශය පෝරමය තුළ සපයා ඇති උපදෙස් සහ මගපෙන්වීම් විශේෂයෙන් 2 වන පිටුවේ "සටහන්" වලට අමතරව, පෝරමය පිරවීමට සහය ලබා දේ. කරුණාකර පෝරමයේ ඇති තොරතුරු හොඳින් කියවා ඒ අනුව සම්පූර්ණ කරන්න. මෙම ලේඛනය අතිරේක උපකාරයක් පමණක් බව සලකන්න.

කඩදාසි ප්‍රමාණය: Legal

දිශානතිය:Landsacape

පෝරමය පිරවීම සඳහා සිංහල භාෂාව යොදා ගන්නේ නම් ඒ සඳහා **Iskoola Pota** යන යුනිකෝඩ් යෙදවුම හා **Adobe Acrobat Reader** යන මෘදුකාංගය මේ සඳහා භාවිතා කල යුතු වේ.

➤ ආවරණය කරන ලද පුද්ගලයාගේ තොරතුරු සමබන්ධයෙන් අදාළ කොටසෙහි ඔවුන්ගේ නම් ඇතුළත් කළ යුතුය.

➤ ආකෘති පත්‍රයේ වෙනත් ආකාරයකින් සඳහන් වන්නේ නම් මිස, අදාළ ක්ෂේත්‍රවල පුද්ගලයන්ගේ නම් මුල් අකුරුවලින් පසුව අවසන් නම සඳහන් කල යුතුය. (උදා: ඒ.බී.පෙරේරා)

➤ අදාළ යම් තැනක, "ස්වාභාවික පුද්ගලයා" යන්නෙන් පුද්ගලයෙකු අදහස් වන අතර "නෛතික පුද්ගලයා" යන්නෙන් සමාගමක් වැනි නෛතික ආස්ථිත්ත්ව අදහස් කරයි.

➤ පෝරමයේ වෙනත් ආකාරයකින් සඳහන් නොවේ නම් මිස "වටිනාකම" සඳහා, ප්‍රකාශ කරන දිනට ප්‍රකාශකයා දන්නා ඇස්තමේන්තුගත මුදලක් ඇතුළත් කළ යුතුය.

➤ ලබා දී ඇති වර්ගීකරණයේ වත්කම් වර්ගය පෝරමයේ සපයා ඇති උදාහරණවලට වඩා වෙනස් නම්, එම වත්කම් ද සඳහන් කර ඇතුළත් කරන්න.

සාමාන්‍ය තොරතුරු

1. මුලකුරු සහිත නම

    - ආකෘතියෙන් ඔබේ නම ඇතුළත් කරන්න: මුල් අකුරින් පසුව අවසාන නම (උදා: ඒ.බී. පෙරේරා).

2. ප්‍රකාශයේ වර්ගය සහ වර්ෂය

    - සුදුසු කාණ්ඩය තේරීමෙන් ප්‍රකාශන වර්ගය තෝරන්න.
    - පළමු පත්වීම (පත්වීම් දිනට වත්කම් සහ බැරකම්)
    - වාර්ෂිකව (මාර්තු 31 වන විට වත්කම් සහ බැරකම්)
    - ධූර කාලය අවසන්වීම (ධූර කාලය අවසන් වීම/ විශ්‍රාම යාම/ සේවයෙන් නෙරපා හැරීම යන්නෙන් සේවය අවසන් වන දිනට වත්කම් සහ බැරකම්)

- පශ්චාත් විශ්‍රාම ගැනීම (ධූර කාලය අවසන් වීම, විශ්‍රාම ගැන්වීම හෝ තනතුරෙන් පහ කිරීම යන්නෙන් සේවය අවසන් වන දින සිට, පිළිවෙලින් පළමු සහ දෙවන වසර සම්පූර්ණ කරන දිනයට වත්කම් සහ බැරකම්)

- තත්කාර්ය (වත්කම් හෝ බැරකම් වෙනස් වීම රුපියල් මිලියන දහයක් හෝ ඊට වැඩි)

- මැතිවරණය (නාම යෝජනා නිකුත් කරන දිනට වත්කම් සහ බැරකම්)

- අදාළ වර්ෂය සඳහන් කරන්න (උදා. 2025).

3. භාරදෙන දිනය

- ඔබ පෝරමය ඉදිරිපත් කරන දිනය ඇතුළත් කරන්න.

4. ආයතනය සහ තනතුර

- ඔබේ ආයතනයේ නම (උදා. මුදල් අමාත්‍යාංශය) සහ ඔබේ වත්මන් නිල තනතුර (උදා. අධ්‍යක්ෂ ජනරාල්) සඳහන් කරන්න

ප්‍රකාශකයාගේ පුද්ගලික තොරතුරු

- සම්පූර්ණ නම
    - ඔබගේ සම්පූර්ණ නම නිල වාර්තාවල දැක්වෙන පරිදි ලබා දෙන්න.
- විදේශ ගමන් බලපත්‍ර අංකය
    - අදාළ වන්නේ නම්, ඔබගේ වත්මන් විදේශ ගමන් බලපත්‍ර අංකය සඳහන් කරන්න.
- බදු ගෙවන්නා හඳුනාගැනීමේ අංකය (TIN)
    - ඔබ ලියාපදිංචි බදු ගෙවන්නෙකු නම් ඔබේ TIN අංකය ඇතුලත් කරන්න.
- ද්විත්ව පුරවැසි භාවය
    - ඔබ ද්විත්ව පුරවැසිභාවය දරන්නේ නම්, අතිරේක රට සඳහන් කර එම රට සඳහා විදේශ ගමන් බලපත්‍ර අංකය ලබා දෙන්න.
- ලිපින විස්තර
    - නිල ලිපිනය: ඔබගේ වත්මන් සේවා ස්ථානයේ ලිපිනය.
    - ස්ථිර නේවාසික ලිපිනය: ඔබගේ නීත්‍යානුකූල ස්ථිර පදිංචිය (ඔබේ වත්මන් ලිපිනයට වඩා වෙනස් නම්).

ප්‍රකාශය ඉදිරිපත් කළ යුත්තේ කවදාද යන්න

ඔබ ඉදිරිපත් කිරීමට හේතුව පිළිබිඹු කරන සුදුසු කොටුව සලකුණු කරන්න:

හේතුව	නියමිත කාලය
පළමු පත්වීම	පත්වීමෙන් මාස තුනක් ඇතුළත
වාර්ෂිකව	සෑම වසරකම ජූනි 30 වැනි දින හෝ ඊට පෙර
ධූර කාලය අවසන් වීම	ධූර කාලය අවසන් වීම/විශ්‍රාම යාම/සේවයෙන් නෙරපා හැරීම සිදු වී දින 14ක් ඇතුළත
පශ්චාත් විශ්‍රාම ගැනීම	ධූර කාලය අවසන් වීම, විශ්‍රාම ගැන්වීම හෝ තනතුරෙන් පහ කළ සේවය අවසන් වන දින සිට පිළිවෙලින් පළමු සහ දෙවන වසර අවසානයේ
මැතිවරණය	නාම යෝජනා ලබාදෙන දිනට
තත්කාර්ය(වත්කම් /බැරකම් වෙනස් වීම)	මාසයක් තුළ

ආවරණය කරන ලද පුද්ගලයන්ගේ වත්කම් සහ බැරකම්

"ආවරණය කරන ලද පුද්ගලයන්" යන්නට:

- ප්‍රකාශකයා (ඔබ)
- ඔබේ සහකරු හෝ සහකාරිය
- යැපෙන දරුවන් (වයස නොසලකා)
- වෙනත් ඕනෑම යැපෙන පුද්ගලයෙක් (ඔබ මත යැපෙන ඕනෑම පුද්ගලයෙක්)
- ප්‍රකාශය ලබා දුන්දිනට අවම වශයෙන් මාස හයකට පෙර ඔබේ නිවස තුළ ජීවත්ව සිටි ඕනෑම පුද්ගලයෙක්
- (ව්‍යතිරේක: අන්‍යෝන්‍ය අයිතිවාසිකම් සහ බැඳීම් බෙදා නොගන්නේ නම්, ඔබ සමග ජීවත්ව සිටි පුද්ගලයෙක් සම්බන්ධව ප්‍රකාශ කිරීම අවශ්‍ය නොවේ)

ඇතුළත් වේ.

ප්‍රතිලාභදායි හිමිකාරිත්වය/ අර්ථදායක ලෙස හිමි වත්කම්:

ප්‍රතිලාභයක් ප්‍රකාශකයා හට ඇත්නම් " වත්කම් සහ බැරකම්" යන්නට හවුල් හිමිකාරීත්වයන් හෝ සන්තකයන් ඇතුළුව සියලුම ආකාරයේ ප්‍රතිලාභදායි හිමිකාරීත්වයන් ඇතුළත් කළ යුතුය.

උදා: වාහන, ආවරණය කරන ලද පුද්ගලයා සැලකිය යුතු කාලයක් ධාවනය කරන්නේ නම්.

ආවරණය කරන ලද පුද්ගලයා සැලකිය යුතු කාලයක් රැඳී සිටින නිවසක්, මහල් නිවාසයක් හෝ වෙනත් ස්ථානයක්.

ආවරණය කරන ලද පුද්ගලයාට ඕනෑම ආකාරයක ප්‍රතිලාභයක් අත්කරදෙන නෛතික ආස්ථිත්වයක්.

1. ප්‍රකාශකයා හැර ආවරණය වන පුද්ගලයන් පිළිබඳ තොරතුරු

ආවරණය කරන ලද එක් එක් පුද්ගලයා සඳහා, විස්තර සපයන්න:

- අවසාන නම සහ වෙනත් නම් (උදා: සිල්වා එච්.එස්.)
- ජාතිකත්වය (උදා: ශ්‍රී ලාංකික)
- ආදායම් බදු අංකය (TIN, අදාළ වන්නේ නම්)
- විදේශ ගමන් බලපත්‍ර අංකය (අදාළ වන්නේ නම්)

2. නිශ්චල දේපල

ආවරණය කරන ලද ඕනෑම පුද්ගලයෙකු සතු සියලුම නිශ්චල දේපල ලැයිස්තුගත කරන්න. එක් එක් දේපල සඳහා, තොරතුරු සපයන්න.

- වර්ගය: පෝරමයේ දී ඇති දේපල වර්ගයෙන් තෝරන්න.
- ප්‍රදේශය/අවකාශය: දේපලෙහි ප්‍රමාණය (අඩි, අක්කර හෝ පර්චස් වලින්) සඳහන් කරන්න.
- ලිපිනය: දේපලෙහි ලිපිනය සපයන්න.
- අත්පත් කරගත් දිනය: එය අත්පත් කරගත් දිනය සඳහන් කරන්න

3. චංචල දේපළ

- පෝරමයේ දී ඇති වර්ගයෙන් දේපල තෝරා සඳහන් කරන්න.

4. **චංචල දේපළ - වාහන**

- වර්ගය: පෝරමයේ දක්වා ඇති ලැයිස්තුවෙන් තෝරාගත් වාහනය සඳහන් කරන්න
- අයිතියේ වර්ගය: නීත්‍යානුකූල අයිතිය සඳහන් කරන්න (උදා: හිමිකාරිත්වය, බදු දීම හෝ භාවිතා කිරීමේ අයිතිය).
- නිෂ්පාදනය සහ මොඩලය: නිෂ්පාදකයාගේ විස්තර ඇතුළත් කරන්න.
- හැඳුනාගැනීමේ අංකය: අදාළ වන්නේ නම්, ලියාපදිංචි හෝ අනුක්‍රමික අංක සපයන්න.
- අත්පත් කර ගැනීමේ ආකාරය: අත්පත් කරගත් දිනය ද ඇතුළත් කරන්න.

5. **සුරැකුම්පත්**

- වර්ගය: පෝරමයේ දක්වා ඇති ලැයිස්තුවෙන් තෝරාගත් සුරැකුම්පත් වර්ගය ඇතුළත් කරන්න.
- අයිතිකාරිත්වයේ වර්ගය: හිමිකාරිත්වය, හවුල් අයිතිය හෝ වෙනත් අයිතිවාසිකම් දක්වන්න.

6. **සාංගමික හිමිකම්**

- නීතිමය ආකෘතිය: ආයතනයේ නෛතික ව්‍යුහය සඳහන් කරන්න (උදා: හවුල්කාරිත්වය).
- ලියාපදිංචිය පිළිබඳ විස්තර: ලියාපදිංචි හඳුනාගැනීම් ඇතුළත් කරන්න (උදා. ලියාපදිංචි අංකය).
- අයිතිකාරිත්වයේ වර්ගය: අයිතිකාරිත්වයේ ස්වභාවය සඳහන් කරන්න (උදා: කොටස් හිමියා, හවුල්කරු).

7. **ස්පර්ශකල නොහැකි වත්කම් සහ බලපත්‍ර**

- වර්ගය: අයිතිකාරිත්වයේ නිවැරදි වර්ගය සඳහන් කරන්න; උදා., පස භාවිතා කිරීමට ඇති නිශ්චිත අයිතිය
- අයිතිකාරිත්වයේ වර්ගය: පෝරමයේ දී ඇති ලැයිස්තුවෙන් තෝරාගත් වත්කම් වර්ග සඳහන් කරන්න.

8. **ආදායම**

8.1 **ත්‍යාග හැර වෙනත් ආදායම්**

- ආදායම් වර්ගය: පෝරමයේ දක්වා ඇති ලැයිස්තුවෙන් තෝරාගත් ආදායම් වර්ගය සඳහන් කරන්න අයිතිකාරිත්වයේ වර්ගය

8.2 **ත්‍යාග ඇතුළු සංචාර ප්‍රතිපූරණයන්**

- කාගෙන්ද: (මූලාශ්‍රය) පරිත්‍යාගශීලියා පිළිබඳ තොරතුරු සපයන්න. (ස්වාභාවික හෝ නෛතික පුද්ගලයා) (උදා. එස්.එස්. ජයලත් / ජේ.ඩී.එච්. හෝල්ඩින්ස්)

9: මූල්‍යමය වත්කම්

- වර්ගය: පෝරමයේ දක්වා ඇති ලැයිස්තුවෙන් තෝරාගත් මුදල් වත්කම් වර්ගය සඳහන් කරන්න.

- අයිතිකාරිත්වයේ වර්ගය: හිමිකාරිත්වයේ ස්වභාවය දක්වන්න (උදා, තනි අයිතිය, හවුල් හිමිකාරිත්වය,හෝ වත්කම පිළිබඳ වෙනත් ඕනෑම ආකාරයක අයිතිවාසිකම්).

- මුදල: වත්කම්වල සම්පූර්ණ වටිනාකම සංඛ්‍යාවලින් සපයන්න.

- මුදල් ඒකකය: මුදල් වර්ගය සඳහන් කරන්න (උදා: LKR, USD, EUR, ආදිය).

- ආස්ථිත්‍යය: ගිණුම පවතින හෝ තැන්පතු කරන ආස්ථිත්‍යය නම සඳහන් කරන්න. අධිකරණ බලය: ආයතනය ශ්‍රී ලංකාවේ ලියාපදිංචි වී තිබේද නැතිනම් විදේශීය අස්ථිත්වයක ද යන්න දක්වන්න

10: මූල්‍ය බැදීම්

- අයිතමය: අනුක්‍රමික අංකය
- වර්ගය: පෝරමයේ දක්වා ඇති ලැයිස්තුවෙන් අදාළ වගකීම් වර්ගය තෝරන්න.
- මුදල: මූල්‍ය වගකීමේ සම්පූර්ණ වටිනාකම සඳහන් කරන්න.
- මුදල් ඒකකය: වගකීමේ මුදල් ඒකකය: (උදා: LKR, USD, EUR, ආදිය) සඳහන් කරන්න.
- ප්‍රතිලාභියා: වගකීම් ලැබිය යුතු පුද්ගලයා හෝ නීතිමය ආයතනය හඳුනා ගන්න.

ආයතන වර්ගය: ප්‍රතිලාභියා ස්වභාවික පුද්ගලයෙක් (තනි පුද්ගල) හෝ නෛතික අස්ථිතියක් ද යන්න දක්වන්න (සමාගම, සංවිධානය) .

- නියමිත දිනය: වගකීමේ නියමිත දිනය හෝ ආපසු ගෙවීමේ අවසාන දිනය සඳහන් කරන්න.

- ඇපකරු: අදාළ වන්නේ නම්, වගකීම සහතික කරන ඕනෑම තෙවන පාර්ශවයක් පිළිබඳ තොරතුරු සපයන්න.

11: වෙනත් ගනුදෙනු (ඉහත ශීර්ෂ යටතේ වන වගු වලින් ආවරණය නොවූ)

- ගනුදෙනු ප්‍රස්තුතය: පෝරමයේ දක්වා ඇති ලැයිස්තුවෙන් අදාළ ප්‍රස්තුතය තෝරන්න.

- ප්‍රති පාර්ශවීය තොරතුරු: නම් සහ අදාළ තොරතුරු ඇතුළුව ගනුදෙනුවට සම්බන්ධ අනෙක් පාර්ශ්වයන් සඳහන් කරන්න.

12: **ආවරණය වන තැනැත්තා රජයේ හෝ පෞද්ගලික ආයතනයක හෝ ඒවායේ පාලක මණ්ඩලවල දරන තනතුරු හෝ සාමාජිකත්වයන්**

- නෛතික සහ සංවිධානාත්මක ආයතනය: පෝරමයේ දක්වා ඇති ලැයිස්තුවෙන් සුදුසු කාණ්ඩය තෝරන්න.
- ලියාපදිංචිය පිළිබඳ විස්තර: ලියාපදිංචි අංකය සහ දිනය තිබේ නම් ඇතුළුව සංවිධානයේ නිල ලියාපදිංචි තොරතුරු සපයන්න.

13: **භාරයන්**

- භාරකරුගේ තොරතුරු: භාරකරුගේ නම සහ සම්බන්ධතා තොරතුරු සපයන්න. (ජංගම සහ ස්ථාවර දුරකථන අංක සහ ලිපිනය ඇතුළුව)
- වත්කම්: භාරයේ තබා ඇති වත්කම් විස්තර කරන්න.
- අදාළ නීතිය: භාරය පාලනය කරන නීතිමය රාමුව සඳහන් කරන්න.

දිවුරුම් හෝ සහතික කිරීමේ අවශ්‍යතාවය

සියලුම ප්‍රකාශ කරන්නන්, දිවුරුම් කොමසාරිස්වරයෙකු හෝ සාම විනිසුරුවරයෙකු ඉදිරියේ දිවුරුම් දීම හෝ සහතික කිරීම යටතේ ඔවුන්ගේ ප්‍රකාශයේ නිරවද්‍යතාවය සහතික කළ යුතුය. දිවුරුම් කොමසාරිස්/සාම විනිසුරුවරයෙකු විසින් ප්‍රකාශකයාගේ අත්සන සහතික කළ යුතුය.

දිවුරුම් කොමසාරිස්වරයෙකු හෝ සාමවිනිසුරුවරයෙකු ඉදිරියේ ප්‍රකාශය නියමිත ස්ථානයකදී සහ නිශ්චිත දිනයකදී දිවුරුම් දීම හෝ තහවුරු කිරීම කළ යුතුය. ප්‍රකාශ කිරීමට අපොහොසත් වීම හෝ අසත්‍ය තොරතුරු සැපයීම 2023 අංක 9 දරන දූෂණ විරෝධී පනත යටතේ නීතිමය දණ්ඩනයට යටත් වේ.

අතිරේක තොරතුරු සහ ඇමුණුම්

(අ) දී ඇති ඉඩ ප්‍රමාණවත් නොවේ නම් පෝරමයේ කිසියම් කොටසක සපයා ඇති ඉඩ ඔබේ තොරතුරු වාර්තා කිරීමට ප්‍රමාණවත් නොවේ නම්, ඔබට අමතර උපලේඛන ඇමිණිය හැක. සෑම උපලේඛනයක්ම පැහැදිලිව අමුණා ඔබ විසින් අත්සන් කළ යුතුය. ඇමුණුම පිළිබඳ අදාල කොටසෙහි දැක්විය යුතුය.

(ආ) ප්‍රකාශ කිරීමට වත්කම් හෝ බැරකම් නොමැත: ඔබට කිසියම් කොටසක ප්‍රකාශ කිරීමට වත්කම් හෝ බැරකම් නොමැති නම්, අදාළ ඉඩෙහි "නැත" යනුවෙන් ලියන්න.

නීති සම්පාදනය සඳහා යොමු කිරීම

ඔබේ වත්කම් සහ බැරකම් ප්‍රකාශ වගකීම් කරන නීතිමය රාමුව පිළිබඳ වැඩිදුර විස්තර සඳහා, කරුණාකර **2023 අංක 9 දරන දූෂණ විරෝධී පනතේ II කොටස** වෙත යොමු වන්න.

වැදගත් සිහිපත් කිරීම්

- සියලුම තොරතුරු නිවැරදි සහ සත්‍ය බව සහතික කර ගන්න.
- දිවුරුම් කොමසාරිස්වරයෙකු හෝ සාම විනිසුරුවරයෙකු ඉදිරියේ පෝරමය අත්සන් කරන්න.
- දිවුරුම් කොමසාරිස්ගේ /සාම විනිසුරුවරයාගේ සහතිකය නිසි පරිදි තැබීමට වග බලා ගන්න.
- ඔබගේ වාර්තා සඳහා ඔබගේ සම්පූර්ණ කරන ලද පෝරමයේ සහ අමතර උපලේඛනවල පිටපතක් ළඟ තබා ගන්න.
- ප්‍රකාශ කිරීමට අපොහොසත් වීමට හෝ වැරදි තොරතුරු සැපයීමට දූෂණ විරෝධී පනත යටතේ නීත්‍යානුකූලව දඬුවම් පැණවිය හැකිය.
- භාරදීම සඳහා දෙපාර්තමේන්තු ප්‍රධානියා විසින් දෙන ලද උපදෙස් අනුව ප්‍රකාශය දෙපාර්තමේන්තු ප්‍රධානියා වෙත ඉදිරිපත් කරන්න.

මෙම උපදෙස් ප්‍රවේශමෙන් අනුගමනය කිරීමෙන්, ඔබ නීතිමය අවශ්‍යතාවලට අනුකූල වීම සහතික කරන අතර ප්‍රකාශ කිරීමේ ක්‍රියාවලියේ විනිවිදභාවය තහවුරු කරයි.

වැඩිදුර පැහැදිලි කරගැනීම් සඳහා 2023 අංක 9 දරන දූෂණ විරෝධී පනතට යොමු විය හැක.
අප ආයතනයේ සහාය අවශ්‍යවේ නම්, පහත දක්වා ඇති යොමු හරහා සම්බන්ධ කරගත හැක.

දුරකථන: 0112 59 63 59/ 076 70 11 954

විද්‍යුත් තැපැල: assets@ciaboc.gov.lk

වෙබ් අඩවිය: www.ciaboc.gov.lk

වත්කම් සහ බැරකම් පිළිබඳ ප්‍රකාශය

(2023 අංක 9 දරන දූෂණ විරෝධී පනතේ 82 වන වගන්තිය යටතේ වන)

මුලකුරු සමග නම

ප්‍රකාශ වර්ගය සහ වර්ෂය

ඉදිරිපත් කළ දිනය

ආයතනය

තනතුර

1. ප්‍රකාශ සිදු කරන තැනැත්තාගේ පුද්ගලික තොරතුරු	
සම්පූර්ණ නම	
ඔබගේ නම ඔබ විසින් පසුගිය වසරේ දී වෙනස් කර ඇත්නම් කරුණාකර ඔබේ පෙර පැවති සම්පූර්ණ නම සඳහන් කරන්න	
උපන් දිනය (දිනය/මාසය/වර්ෂය)	
ස්ත්‍රී පුරුෂ භාවය (ස්ත්‍රී/පුරුෂ/වෙනත්)	
ජාතික හැඳුනුම්පත් අංකය	
විදේශ ගමන් බලපත්‍ර අංකය	
බදු ගෙවන්නා හඳුනා ගැනීමේ අංකය	
ඔබ ද්විත්ව පුරවැසිභාවය හිමි අයෙක්ද ? පිළිතුර ඔව් නම්, එම රටේ විදේශ ගමන් බලපත්‍ර අංකය සඳහන් කරන්න	
පුද්ගලික විද්‍යුත් ලිපිනය සහ සම්බන්ධ කර ගත හැකි දුරකථන අංකය/අංක (ජංගම හා ස්ථාවර)	
රාජකාරි විද්‍යුත් ලිපිනය සහ සම්බන්ධ කර ගත හැකි දුරකථන අංකය /අංක (ජංගම හා ස්ථාවර)	
රාජකාරි ලිපිනය	
වත්මන් පදිංචිය සහිත ලිපිනය	
ස්ථිර පදිංචිය සහිත ලිපිනය	

සටහන්

(1) 2023 අංක 9 දරන දූෂණ විරෝධී පනත (මෙහි මින් මතු "පනත" යනුවෙන් හඳුන්වනු ලබන) මඟින් නම් කරනු ලබන රජයේ නිලධරයන්, මැතිවරණ අපේක්ෂකයින් සහ පනතේ 80 වන වගන්තියේ (1) වන උපවගන්තියේ සඳහන් කරන ලද තැනැත්තන්, ශ්‍රී ලංකාව තුළ සහ ඉන් බැහැරව පවතින ඔවුන්ගේ වත්කම් සහ බැරකම් පිළිබඳ ප්‍රකාශ කලින් කලට ඉදිරිපත් කළයුතුය. මෙම වත්කම් සහ බැරකම් ප්‍රකාශයට -

(අ) (මෙහි මින් මතු "ප්‍රකාශකයා" යනුවෙන් හඳුන්වනු ලබන) ප්‍රකාශය සිදු කරන තැනැත්තාගේ වත්කම් සහ බැරකම්;

(ආ) ඔහුගේ කලත්‍රයාගේ වත්කම් සහ බැරකම්;

(ඇ) ඔහුගෙන් යැපෙන එක් එක් දරුවන්ගේ වයස නොසලකා එම එක් එක් දරුවන්ගේ සියළු වත්කම් හා බැරකම්;

(ඈ) ඔවුන්ගේ වයස නොසලකා ඔහුගෙන් යැපෙන වෙනත් තැනැත්තන්ගේ සියළු වත්කම් සහ බැරකම්; සහ

(ඉ) ඒ තැනැත්තා පනතේ II වන කොටසට අදාළ වන තැනැත්තා සමඟ අන්‍යෝන්‍ය අයිතිවාසිකම් සහ බැඳීම් භුවමාරු කර නොගන්නා අවස්ථාවකදී හැර, ප්‍රකාශයේ දිනයට අවම වශයෙන් මාස හයකටවත් පෙරාතුව මේ කොටස අදාළ වන තැනැත්තා සමඟ පොදු නිවසක සහවාසයෙන් ජීවත්වන විටදී එකී වෙනත් යම් තැනැත්තාගේ සියළු වත්කම් සහ බැරකම්,

ඇතුළත් විය යුතුය.

(2) (1) වන සටහනේ (අ), (ආ), (ඇ), (ඈ) සහ (ඉ) හි හඳුන්වනු ලබන තැනැත්තන්, මෙම ආකෘති පත්‍රය තුළ මින් ඉදිරියට "ආවරණය වන තැනැත්තන්" යනුවෙන් හඳුන්වනු ලැබිය යුතුය.

(3) මෙම වත්කම් සහ බැරකම් ප්‍රකාශය, පනතේ II වන කොටසේ විධිවිධානවලට යටත්ව, පහත වගුවේ දක්වා ඇති ඕනෑම එක් හේතුවක් සඳහා ගොනු කිරීමට අවශ්‍ය වේ. කරුණාකර පහත උචිත කොටුව සලකුණු කිරීමෙන් හේතුව තහවුරු කරන්න.

(4) අදාළ වත්කම් සහ බැරකම් ප්‍රකාශ ඉදිරිපත් කිරීමට අපොහොසත්වීම, අවශ්‍ය සියළු වත්කම් සහ බැරකම් ඇතුළත් කිරීමට අපොහොසත්වීමට හෝ වත්කම් බැරකම් ප්‍රකාශ තුළ අසත්‍ය ප්‍රකාශයක් සිදු කිරීම ඇතුළුව පනතේ II වන කොටසේ අවශ්‍යතාවයන්ට අනුගත වීමට අපොහොසත්වීම, පනතේ 90 වන වගන්තිය යටතේ වරදක් වන අතර ප්‍රකාශයට ඇතුළත් කළයුතු එහෙත් ප්‍රකාශයෙන් ඉවත් කරන ලද ඕනෑම වත්කමක් රජය සතු විය යුතුය.

(5) ඔබ වත්කම් සහ බැරකම් ප්‍රකාශයක් ගොනු කළයුතු තැනැත්තකු නොවේ යැයි ඔබ සිතන්නේ නම් හෝ ඔබ විසින් ප්‍රකාශය තුළ සඳහන් කළ යුත්තේ කුමන තොරතුර ද යන්න පිළිබඳ යම් ගැටළුවක් ඇත්නම්, අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාව අමතන්න.

දුරකථන අංකය : 0112596359; 0767011954;

විද්‍යුත් ලිපිනය : assests@ciaboc.gov.lk ; වෙබ් අඩවිය : www.ciaboc.gov.lk

වත්කම් සහ බැරකම් ප්‍රකාශය සිදු කළ යුතු අවස්ථා			
ප්‍රකාශය ඉදිරිපත් කිරීමට හේතුව (උචිත කොටුව සලකුණු කරන්න)		ප්‍රකාශ කල යුතු දිනය	
(i)	රාජ්‍ය සේවයේ පත්වීමක් ලැබීම (පළමු පත්වීම්)	පත්වීම ලැබී මාස තුනක් ඇතුළත	
(ii)	රජයේ නිලධාරියෙකු ලෙස සේවය කරන අතරතුර වාර්ෂිකව (වාර්ෂික)	සෑම වර්ෂයකම මාර්තු 31 වැනි දින	
(iii)	රජයේ සේවයෙන් හැරයාමේදී (ධූරකාලය අවසානය)	රජයේ සේවය හැර යාමෙන් දින 14ක් ඇතුළත	
(iv)	හිටපු රාජ්‍ය නිලධාරියෙකු වීම (විශ්‍රාම ගැනීමෙන් පසු)	ධූර කාලය අවසන් වීමෙන් පසු අනුගාමී වසර දෙකකින් වත්කම් සහ බැරකම් ප්‍රකාශ කිරීම	
(v)	ජනාධිපතිවරණය, පාර්ලිමේන්තු, පළාත් සභා හෝ පළාත් පාලන ආයතනයක අපේක්ෂයකු වීම (මැතිවරණ)	නාම යෝජනා පත්‍රය ඉදිරිපත් කිරීමේ දී	
(vi)	රු. මිලියන 10 හෝ ඊට වැඩි වෙනසක් වත්කම්/ බැරකම් වල සිදුවීම (තත්කාර්ය)	මාසයක් ඇතුළත	

පොදු උපදෙස් :

(1) සියළුම දිනයන් සඳහන් කිරීමේදී දිනය/මාසය/වර්ෂය යන ආකෘතියට අනුව ද වර්ෂය ඉලක්කම් හතරක් සහිතව ද සඳහන් කළ යුතු ය.

(2) වත්කම් සඳහන් කිරීමේ දී, එය මිළදී ගැනීමක් ද, රික්තිවරණයක් ද, ත්‍යාගයක් ද හෝ වෙනත් ආකාරයකින් ලද දෙයක් ද යන්න පිළිබඳව සඳහන් කරන්න. වෙනත් ආකාරයකින් අත්පත් කරගත් දෙයක් නම් ඒ කෙසේ ද යන්න පැහැදිළි කරන්න. ප්‍රසිද්ධියේ වෙළඳාම් කරන ලද සුරැකුම් පත් හැර, මිළදී ගත් අනෙක් සියළු වත්කම් මිළදී ගත් මුදල සඳහන් කර, ප්‍රකාශය ඉදිරිපත් කරන අවස්ථාව වන විට ඒවායේ වටිනාකම පිළිබඳ සද්භාවීය ඇස්තමේන්තු අගයක් සඳහන් කරන්න.

(3) ආවරණය වන තැනැත්තකු විසින් දරනු ලබන වත්කම් සඳහන් කිරීමේ දී, ශ්‍රී ලංකාවේ හෝ විදේශයන්හි දරනු ලැබූ වත්කම් ඇතුලත් කරන්න. හිමිකම සඳහන් කිරීමේදී ආවරණය වන පුද්ගලයාගේ නමින් නීත්‍යානුකූලව හිමිකම් කියන හෝ ලියාපදිංචි කර ඇති ඕනෑම වත්කමක් පමණක් නොව, හවුල් හිමිකාරීත්වය හෝ භුක්තිය ඇතුළුව ප්‍රකාශකයාට ප්‍රතිලාභයක් හෝ භාවිතයක් ඇති ඕනෑම දේපලක් ඇතුළත් කරන්න. උදාහරණයක් ලෙස, ආවරණය වන තැනැත්තා විසින් සැලකිය යුතු කාලයක් පදවන මෝටර් රථයක් හෝ ආවරණය වන තැනැත්තා සැලකිය යුතු කාලයක් ගතකරන නිවසක් හෝ බද්ධ නිවසක් දැක්විය හැකි ය.

<u>ආවරණය වන තැනැත්තන්ගේ වත්කම් හා බැරකම් පිළිබඳ විස්තර</u>

1. ප්‍රකාශකයාට අමතරව ආවරණය වන තැනැත්තන් පිළිබඳ තොරතුරු

ආවරණය වන තැනැත්තාගේ වාසගම සහ වෙනත් නම්	උපන් දිනය	ජාතිය	ආදායම් බදු අංකය	ජාතික හැඳුනුම්පත් අංකය	විදේශ ගමන් බලපත්‍රය	වර්තමාන ලිපිනය	ස්ථිර ලිපිනය

2. ආවරණය වන තැනැත්තන් විසින් දරනු ලැබූ නිශ්චල දේපළ

ආවරණය වන තැනැත්තා	ලිපිනය	වර්ගය *	වර්ගඵලය, අවකාශය (වර්ග අඩි/අක්කර /පර්චස්)	අත්පත්කරගත් දිනය/ අත්කරගත් අයිතිවාසිකම්/ ඉඩම් රෙජිස්ට්‍රාර් කාර්යාලයේ අංකය **	අත්පත්කරගත් ආකාරය (තෑගි හෝ මිලදී ගැනීම ආදී)	වටිනාකම	සම අයිතිකරුවකුගේ හෝ දේපළෙහි අයිතිවාසිකම් ඇති වෙනත් නෛතික හෝ ස්වභාවික තැනැත්තකුගේ නම්

* (1) ඉඩම් කට්ටිය; (2) නේවාසික ගොඩනැගිල්ල; (3) බද්ධ නිවාස; (4) කාර්යාලය; (5) වාණිජ ගොඩනැගිල්ල; (6) ගරාජය; (7) ගබඩාව; (8) වෙනත් (නිශ්චිතව සඳහන් කරන්න)

** අත්පත්කරගත් දිනය, අත්කරගත් අයිතිවාසිකම් (අයිතිය, බද්ද හෝ වෙනත් භාවිත කිරීමේ හෝ භුක්ති විඳීමේ අයිතිය) ඉඩම් රෙජිස්ට්‍රාර් කාර්යාලයේ අංකය

3. **චංචල දේපළ**

ප්‍රකාශයට පත් කල යුතු දේපළ: රුපියල් ලක්ෂ පහක්(රු.500,000.00) ඉක්මවන වටිනාකමකින් යුතු චංචල දේපළ. චංචල දේපළ යන්නෙන්, ආරක්ෂක තැන්පතු සේප්පු (හදුනාගැනීමේ අංකය) ඇතුළුව හානිවීමකින් තොරව ගෙන යා හැකි යම් ද්‍රව්‍යමය අයිතමයන් අදහස් වේ.

ප්‍රකාශයේ මේ කොටස තුල පහත දැක්වෙන දේපළ ප්‍රකාශයට පත් නොකළ යුතුයි. (සුරැකුම්පත්; ආයතනික අයිතිවාසිකම්; මුදල්; බැංකු සහ වෙනත් මුල්‍ය ආයතනවල ගිණුම්වල ඇති මුදල්; (බැංකුවක වන) වටිනා ලෝහ සහ මුදල් ආකාරයෙන් ලද ත්‍යාග

ආවරණය වන තැනැත්තා	වර්ගය *	බර /ප්‍රමාණය	ලක්ෂණ		**අත්කර ගත් දිනය සහ අත්කරගත් ආකාරය**	වටිනාකම	(දේපළට සම අයිතිය ඇත්නම්) **	(සන්තකයේ තබා ගැනීමේ හෝ පාවිච්චි කිරිමේ අයිතිය යටතේ දේපළ අත්පත්කරගෙන ඇත්නම්) ***
			අයිතියේ වර්ගය	වෙළඳ ළකුණ හෝ නිෂ්පාදකයාගේ නම				

* (1) පෞරාණික භාණ්ඩ; (2) සිතුවම්; (3) රන්, රිදී, ප්ලැටිනම් හෝ වෙනත් යම් වටිනා ලෝහ; (4) ඔරලෝසු; (5) වෙනත් ස්වර්ණාභරණ (නිශ්චිතව සඳහන් කරන්න); (6) මුද්දර එකතු; (7) කාසි සහ (8) රුපියල් දෙලක්ෂ පනස් දහස නොඉක්මවන වටිනාකමින් යුතු (රු.250,000.00) මැණික්, දියමන්ති හෝ වෙනත් යම් වටිනා පාෂාණ මෙම කොටස යටතේ ප්‍රකාශයට පත් කල යුතුයි.

** (දේපළට සම අයිතිය ඇත්නම්) සම අයිතිකරුවන්ගේ තොරතුරු එක් එක් සම අයිතිකරුට අයිති ප්‍රතිශතය ඇතුළත් කරන්න (ස්වභාවික තැනැත්තා හෝ නෛතික තැනැත්තා)

***(සන්තකයේ තබා ගැනීමේ හෝ පාවිච්චි කිරිමේ අයිතිය යටතේ දේපළ අත්පත්කරගෙන ඇත්නම්) දේපළෙහි අයිතිකරු පිළිබඳ තොරතුරු (ස්වභාවික තැනැත්තා හෝ නෛතික තැනැත්තා)

4. **චංචල දේපළ - වාහන**

ප්‍රකාශයට පත්කළ යුතු දේපළ: වටිනාකම කුමක් වුව ද වාහන සහ වෙනත් ස්වයං-චලිත යන්ත්‍ර සහ යාන්ත්‍රණ

ආවරණය වන තැනැත්තා	වර්ගය *	අයිතියේ වර්ගය	නිෂ්පාදිත රට සහ මාදිලිය (වෙළඳ ලකුණ)	එන්ජිමෙහි සිලින්ඩර ධාරිතාව (සීසී)	නිශ්පාදිත වර්ෂය	හඳුනා ගැනීමේ අංකය (අදාල වේ නම්)	අත්පත්කර ගත් ආකාරය	වටිනාකම	දේපළට සම අයිතිකරුවන් ඇත්නම් **	(සන්තකයේ තබා ගැනීමේ හෝ පාවිච්චි කිරීමේ අයිතිය යටතේ දේපළ අත්පත්කරගෙන ඇත්නම්) ***

* (1) යතුරුපැදි; (2) මෝටර් ට්‍රයිසිකල්; (3) මෝටර් කාර්; (4) ද්විත්ව කාර්යය වාහන; (5) ඉඩම් වාහන; (6) මෝටර් ලොරි; (7) බස් රථ; (8) ට්‍රේලර් සහ බවුසර්; (9) විශේෂ කාර්යය වාහන; (10) ලොරි ට්‍රේලර්; (11) ප්‍රයිම් මුවර්ස්; (12) ගිලන් රථ; (13) කොඩ්‍රසයිකල්; (14) ට්‍රැක්ටර්ස්; (15) අවමංගල රථ; (16) වෙනත් විශේෂ කාර්යය වාහන; (17) මෝටර් නිවහන; (18) කෘෂිකාර්මික යන්ත්‍ර; (19) ජලයේ ගමන් කරන වාහන; (20) ගුවනේ ගමන් කරන වාහන; (21) වෙනත් (නිශ්චිතව සඳහන් කරන්න)

** (දේපළට සම අයිතිය ඇත්නම්) සම අයිතිකරුවන්ගේ තොරතුරු එක් එක් සම අයිතිකරුට අයිති ප්‍රතිශතය ඇතුළත් කරන්න (ස්වභාවික තැනැත්තා හෝ නෛතික තැනැත්තා)

***(සන්තකයේ තබා ගැනීමේ හෝ පාවිච්චි කිරීමේ අයිතිය යටතේ දේපළ අත්පත්කරගෙන ඇත්නම්) දේපළෙහි අයිතිකරු පිළිබඳ තොරතුරු (ස්වභාවික තැනැත්තා හෝ නෛතික තැනැත්තා)

5. **සුරැකුම්පත්**

ආවරණය වන තැනැත්තා	වර්ගය *	අයිතියේ වර්ගය	සුරැකුම්පත නිකුත් කරන්නා (ස්වභාවික තැනැත්තා හෝ නෛතික තැනැත්තා)	අත්පත්කරගත් දිනය සහ අත්පත්කරගත් ආකාරය	වටිනාකම **	සුරැකුම්පත් ප්‍රමාණය	කළමණාකරණය කිරීම සඳහා සුරැකුම්පත් පවරන ලද තැනැත්තා පිළිබඳ තොරතුරු(ස්වභාවික තැනැත්තා හෝ නෛතික තැනැත්තා)

*සුරැකුම්පතක් යනු රාජ්‍ය සහ පෞද්ගලික වෙළඳපොළවල්හි ප්‍රාග්ධනය ඉහළ නැංවීම සඳහා භාවිතා කරනු ලබන ප්‍රතිමෝජනය කළ හැකි මූල්‍යමය සාධන පත්‍රයකි.
(1) කොටස්; (2) ණය සුරැකුම්පත්; (3) සාංගමික බැඳුම්කර; (4) මහ බැංකු බැඳුම්කර; (5) භාණ්ඩාගාර බැඳුම්කර; (6) බඳු සංචිත සහතිකපත්; (7) බැදීම්; (8) ඉතිරි කිරීම් (තැම්පතු) සහතික; (9) පොරොන්දු නෝට්ටු; (10) ජාත්‍යන්තර මූල්‍ය ආයතනවල බැඳුම්කර; (11) විදේශීය රජයන්ගේ බැඳුම්කර; (12) ස්වභාවික තැනැත්තන්ගේ බැංකු තැම්පතු අරමුදලේ බැඳුම්කර; (13) චෙක්පත්; (14) ආයොජන සහතික; (15) උකස් සුරැකුම්පත්; (16) උකස් බැඳුම්කර; (17) උකස් සහතික; (18) උකස් ඇපකර; (19) ව්‍යුත්පන්න; (20) පුද්ගලකරණය කළ සුරැකුම්පත් (වවුචර් ආදිය); (21) භාණ්ඩවල හිමිකම් ලේඛන; (22) වෙනත් වර්ගය (නිශ්චිතව සඳහන් කරන්න)

* වටිනාකම (ප්‍රසිද්ධියේ අලෙවි කළ සුරැකුම්පත් සඳහා මෙය ගොනු කිරීමට පෙරාතුව වූ දිනයේ වූ අවසන් මිල අලෙවි නොකළ මිල දී ගත් සුරැකුම්පත් සඳහා ගෙවූ මිල රික්තවරණ ත්‍යාග හෝ මෙය ගොනු කරනු ලබන අවස්ථාවකදී වන සද්භාවයෙන් සිදුකරන ලද වෙනත් යම් ඇස්තමේන්තු සඳහන් කරන්න)

6. සාංගමික හිමිකම

ප්‍රකාශයට පත්කළ යුතු දේ: ඉහත "5. සුරැකුම්පත්" ශීර්ෂය යටතේ වන වගුවේ සඳහන් කර ඇති සුරැකුම්පත් අමතරව සීමිත හෝ පොදු හවුල්කාරීත්වයන්හි හෝ ණය දෙන සමිතිවල කොටස් ද ඇතුළුව සහ යම් කොටස් හිමිකම් ද ඇතුළුව ශ්‍රී ලංකාවේ හෝ විදේශ රටක ලියාපදිංචි කරන ලද නෛතික ආස්ථිතව්‍යවල ව්‍යවස්ථාපිත ප්‍රාග්ධනයට සමාන වෙනත් යමක්.

ආවරණය වන තැනැත්තා	ප්‍රකාශයකට කොටස් අයත් කොටස් සහ ආස්ථිතයේ නම	ආස්ථිතයේ ප්‍රධාන කාර්යාලය ලියාපදිංචි නම	ආස්ථිතයේ සංවිධානාත්මක සහ නෛතික ආකෘතිය	ලියාපදිංචි කිරීමේ විස්තර	අයිතියේ වර්ගය	ප්‍රග්ධනය හෝ එයට සම වුවක නෛතික පුද්ගලික හිමි කොටස		
						මුල්‍යමය පදනමින් (වටිනාකම)		ප්‍රතිශතයක් ලෙස (%)
						සමස්ත	පසුගිය වර්ෂයේදී අත්පත් කර ගැනීම	

7. ස්පර්ශ කළ නොහැකි වත්කම් හා බලපත්‍ර

ස්පර්ශ කළ නොහැකි වත්කම් යටතට බුද්ධිමය දේපළ (නව නිපැයුම්, ප්‍රයෝජනවත් ආකෘති, දැනුම, කාර්මික සැලසුම් හෝ නව ශාක ප්‍රබේද, වෙළඳ ලකුණ ලකුණ හෝ වෙළඳ නාමය, ප්‍රකාශන අයිතිය, පේටන්ට් බලපත්‍ර යනාදිය සඳහා ඇති හිමිකම), යටිපස හා වෙනත් ස්වභාවික සම්පත් ප්‍රයෝජනයට ගැනීම සඳහා ඇති අයිතිය හෝ වෙනත් යමක් (නිශ්චිතව සඳහන් කරන්න) අයිත් වේ.

ආවරණය වන තැනැත්තා	වර්ගය (බුද්ධිමය දේපළ හිමිකම(වර්ගය නිශ්චිතව සඳහන් කරන්න) යටිපස හා වෙනත් ස්වභාවික සම්පත් ප්‍රයෝජනයට ගැනීම සඳහා අයිතිය/ වෙනත් (නිශ්චිත සඳහන් කරන්න))	අයිතිවාසිකමේ අරමුණ පිළිබඳ විස්තරය (වත්කම සඳහා හිමිකම සහතික කරන නිල ලියවිල්ලට අනුව අදාල වේ නම් එම නිල ලියවිල්ලේ පෙළ සහ අංකය සඳහන් කරන්න)	හිමිකම් වර්ගය	අත්කරගත් දිනය	අත්කරගත් ආකාරය	වටිනාකම

8. ආදායම

8.1 ත්‍යාග හැර වෙනත් ආදායම්

ආවරණය වන පුද්ගලයා	ආදයම් වර්ගය *	හිමිකම් වර්ගය	ආදායම් මූලාශ්‍රය (ස්වභාවික තැනැත්තා හෝ නෛතික තැනැත්තා)	පූර්ව ලිත් වර්ෂයේ දී ඉපයූ මුදල් ප්‍රමාණය

* ආදායම් යන්නෙන්, 2017 අංක 24 දරන දේශිය ආදායම් පනතේ 4,5,6,7 සහ 8 වන වගන්තිවල නිශ්චිතව දක්වා ඇති තක්සේරු කළහැකි ආදායම අදහස් වන අතර, ඊට, (1) වැටුප (දිරි දීමනා සහ වන්දි ගෙවීම් ඇතුළත් මූල්‍යමය දීමනා); (2) ගරු දීමනා හෝ ගිවිසුම්වලට අනුව සිදුකරනු ලබන ගෙවීම්; (3) ව්‍යවසායක කටයුතුවලින් ලැබෙන ආදායම; (4) ස්වාධීන වෘත්තිමය කටයුතු වලින් ලැබෙන ආදායම; (5) ඉඩකඩම් විකිණීමෙන් ලැබෙන ආදායම (සුරැකුම් හැර); (6) චංචල දේපළ විකිණීමෙන් ලැබෙන ආදායම; (7) දේපළ බදු දීමෙන් ලැබෙන ආදායම; (8) ලාභාංශ; (9) පොළිය; (10) කතෘ භාග; (11) රක්ෂණ ගෙවීම්; (12) පුණ්‍යාධාර; (13) විශ්‍රාම වැටුප; (14) උරුමයෙන් ලැබෙන ආදායම; (15) සුරැකුම්පත් සහ කොටස් විකිණීමෙන් ලැබෙන ආදායම(වර්ගය නිශ්චිතව සඳහන් කරන්න); (16) අනුග්‍රාහිත සංචාර සහ සේවාවලින් ලැබෙන ආදායම්; (17) වාහන; (18) ශිෂ්‍යත්ව; (19) වෙනත් ආදායම් (නිශ්චිතව සඳහන් කරන්න); (20) රාජ්‍ය ආස්ථිත්‍ය සමග ඇති කරගත් ගිවිසුම්, ආදිය නිදර්ශන ලෙස දැක්විය හැකි නමුත් ඒවාට සීමා නොවන ආදායම් ඇතුළත් වේ.

8.2 ත්‍යාග ඇතුළු සංචාර ප්‍රතිපූරණයන්

ඉහත සඳහන් කර තිබුණද, පවුලේ සමීපතම සාමාජිකයකු නොවන යම් තැනැත්තකුගෙන් හෝ ආයතනයකින් පසුගිය වර්ෂයේ දී සමස්ත අගය රුපියල් පනස්දහසක් (රු.50,000.00) ඉක්මවා එක් තනි මූලාශ්‍රයකින් ලද සංචාර ප්‍රතිපූරණ ඇතුළු යම් ත්‍යාග ලැයිස්තුගත කරන්න.

ලබන්නා	ත්‍යාගය පිළිබඳ විස්තරය	ලද දිනය	කවරකුගෙන් ද යන වග	වටිනාකම පිළිබඳ සද්භාවීය ඇස්තමේන්තුව

9. **මූල්‍යමය වත්කම්**

ප්‍රකාශයට පත්කළ යුතු වත්කම්: මුදල්, ඩිජිටල් ව්‍යවහාර මුදල්, බැංකු ගිණුම්වල ඇති අරමුදල්, ණය දෙන සමිති සහ අන්‍යෝන්‍ය ආයෝජන ආයතන ඇතුළු බැංකු නොවන මූල්‍යමය ආයතනවලට සිදුකර ඇති දායකත්ව මුදල්, තුන්වන පාර්ශවය සඳහා ලබා දී ඇති ණය : වටිනා ලෝහ ආකාරයෙන් ඇති වත්කම් (බැංකුවල පවතින) සහ වෙනත් (නිශ්චිතව සඳහන් කරන්න)

ආවරණය වන තැනැත්තා	වර්ගය *	අයිතිවාසිකමේ වර්ගය	මුදල් ප්‍රමාණය	ව්‍යවහාර මුදල්	අදාළ ගිණුම් විවෘත කර ඇති හෝ මුදල් තැන්පත් කරනු ලබන ආස්ථිත්‍ය ශ්‍රී ලංකාවේ හෝ විදේශ ආස්ථිත්‍යයක ලියාපදිංචි වූ තැනැත්තකු	මුදල් ණයට දෙනු ලැබ ඇති තැනැත්තා හෝ ආස්ථිත්‍යය

* (1) මුදල්; (2) ඩිජිටල් ව්‍යවහාර මුදල්; (3) බැංකු ගිණුම්වල ඇති අරමුදල් (ගිණුම් අංකය සඳහන් කරන්න); (4) අන්‍යෝන්‍ය ආයෝජන ආයතන ඇතුළු ණය දෙන සමිති සහ බැංකු නොවන මූල්‍යමය ආයතනවලට සිදු කර ඇති දායකත්ව මුදල් (ආයතනයේ වර්ගය සහ ගිණුම් අංකය සඳහන් කරන්න); (5) තෙවන පාර්ශ්වවලට ණයට ලබාදී ඇති මුදල්; (6) වටිනා ලෝහ ආකාරයෙන් ඇති වත්කම්; (7) වෙනත් (නිශ්චිතව සඳහන් කරන්න)

10. මූල්‍ය බැඳීම්

බැඳීම් වටිනාකමෙහි සමස්ත අගය රුපියල් ලක්ෂ පහ (රු.500,000.00) ඉක්මවන්නේ නම් සඳහන් කරන්න.

ආවරණය වන තැනැත්තා	අයිතමය	වර්ගය*	මුදල් ප්‍රමාණය	මුදල් වර්ගය	බැඳීම ඇති වූ තැනැත්තා (ස්වභාවික තැනැත්තා හෝ නෛතික තැනැත්තා)	බැඳීම් ඇති වූ දිනය	පියවිය යුතු දිනය	බැඳීම සඳහා සිටින ඇපකරුවන් පිළිබඳ තොරතුරු (ඇපකරුවෙක් මගින් බැඳීම සුරක්ෂිත කර ඇත්නම්)

* (1) ලැබූ ණය මුදල්; (2) ලැබූ ණය; (3) කල්බදු ගිවිසුම් යටතේ වන බැඳීම්; (4) මූලික ණය මුදලේ කොටස වශයෙන් ගෙවන මුදල් ප්‍රමාණය; (5) ණය මුදල් පොළිය සඳහා ගෙවන ලද මුදල් ප්‍රමාණය/රක්ෂණ ගිවිසුම යටතේ වූ බැඳීම්; (6) රාජ්‍ය නොවන විශ්‍රාම වැටුප් ලබාදීමේ ගිවිසුම යටතේ වන බැඳීම්; (7) වෙනත් තැනැත්තන් විසින් ප්‍රකාශක වෙත ණයට ලබාදුන් මුදල; (8) වෙනත් තැනැත්තන් විසින් ප්‍රකාශක නොවන ආවරණය වන තැනැත්තන් වෙත ලබාදෙන ලද මුදල්; (9) හිඟ බදු මුදල්; (10) වෙනත් (නිශ්චිතව සඳහන් කරන්න)

11. **වෙනත් ගණුදෙනු (ඉහත ශීර්ෂ යටතේ වන වගුවලින් ආවරණය නොවූ)**

ආවරණය වන තැනැත්තා	ගණුදෙනු වර්ගය *	ගණුදෙනුවේ අරමුණ **	ගණුදෙනුවේ අනෙක් පාර්ශවය පිළිබඳ තොරතුරු

*ආවරණය වන තැනැත්තාගේ හිමිකම් අයිතිවාසිකම් මගින් ලබා ගැනීමෙන් ජනිත වූ ගනුදෙනුව (හවුල් හිමිකම් ද ඇතුළුව); සන්තකය හෝ භුක්තිය ලබා ගැනීමේ දී සිදු වූ ගනුදෙනුව/ ප්‍රකාශකගේ හිමිකම් අයිතිවාසිකම්, සන්තකය හෝ භාවිතය අවසාන වීම/ ආවරණය වන තැනැත්තාගේ මූල්‍යමය බැඳීම (නිශ්චිතව දක්වන්න)

** (1) දේපළ ඉඩකඩම්; (2) ඉඩම් කට්ටිය; (3) නේවාසික ගොඩනැගිලි; (4) බද්ධ නිවාස; (5) වාණිජ ගොඩනැගිලි; (6) ගරාජය; (7) වෙනත් දේපොළ (නිශ්චිතව සඳහන් කරන්න); (8) චංචල දේපොළ; (9) වාහන; (10) සුරැකුම්පත්; (11) මූල්‍යමය වත්කම්; (12) ආභරණ; (13) පුද්ගල සහ ගෘහ විදුලි උපකරණ; (14) ඇඳුම්; (15) පශු සම්පත්; (16) රන්, රිදී, ප්ලැටිනම් හෝ වෙනත් යම් වටිනා ලෝහ; (17) පෞරාණික භාණ්ඩ; (18) සිතුවම්; (19) වෙනත් දේපළ (නිශ්චිතව සඳහන් කරන්න); (20) ස්පර්ශ කළ නොහැකි වත්කම් (නිශ්චිතව දක්වන්න); (21) සංචාරක (පවුලේ සියලු සාමාජිකයන්ගේ මුළු සංඛ්‍යාව; (22) අධ්‍යාපනය (පෞද්ගලික පාසල් හෝ විශ්ව විද්‍යාල); (23) විනෝදාස්වාදය.

12. **ආවරණය වන තැනැත්තා රජයේ හෝ පෞද්ගලික ආයතනයක හෝ ඒවායේ පාලක මණ්ඩලවල දරන තනතුරු හෝ සාමාජිකත්වයන්**

ප්‍රකාශයට පත් කළ යුතු දේ: ප්‍රජා සමාගම්, පුණ්‍යායතන, ස්වයං නියාමක හෝ ස්වයං පාලක වෘත්තීමය සංවිධානයන්හි කළමනාකරණ, විගණන හෝ අධීක්ෂණ මණ්ඩලයක සාමාජිකයකු වශයෙන් ආවරණය වන තැනැත්තා සහභාගිවීම සහ එවැනි සමාගම් (සංවිධාන) වල දරනු ලබන සාමාජිකත්වය.

යම් කාලසීමාවක් සඳහා වාර්තා කරන කාල පරිච්ඡේදය අතරතුරදී ආවරණය වන තැනැත්තා එම සංවිධානයේ විශේෂිත තනතුරක් දැරුවේ නම් හෝ සාමාජිකයෙකු වී සිටියේ නම් පහත දැක්වෙන තොරතුරු සඳහන් කළ යුතු ය.

ආවරණය වන තැනැත්තා	සංවිධානයේ/ මණ්ඩලයේ නම	නෛතික හා සංවිධානමය ස්වභාවය*	ලියාපදිංචිය පිළිබඳ විස්තර

* (1) ප්‍රජා සමාගම්; (2) පුණ්‍යායතන; (3) ස්වයං නියාමක හෝ ස්වයං පාලක වෘත්තීමය සංවිධාන; (4) භාරකාර මණ්ඩල හා පදනම්; (5) පුද්ගලික අංශය හෝ රාජ්‍ය අංශය විසින් හිමිකාරීත්වය දරන ව්‍යාපාර; (6) පොදු හෝ සීමිත හවුල් ව්‍යාපාර; (7) වෙනත් යම් වර්ගයක නෛතික තැනැත්තන් (නිශ්චිතව සඳහන් කරන්න)

13. **භාරයන්**

භාරයක, ඒ හා සමාන නෛතික ආස්ථිත්‍යයක හෝ ගිවිසුම්ගත විධිවිධානවලින් ආවරණය වන තැනැත්තා සඳහා යම් පුද්ගලයකු හෝ ආස්ථිත්‍යයක් යම් වත්කමක් තබා ගන්නේ ද? එසේ නම් ඒ භාරය, ආස්ථිත්‍ය හෝ ගිවිසුම්ගත විධිවිධාන ස්ථාපිත කරන සියලු ලේඛනවල පිටපතක් ලබා දී ලේඛනයේ සඳහන් පරිදි පහත තොරතුරු ලැයිස්තුගත කරන්න

භාරකරුගේ නම/ සම්බන්ධ කර ගැනීමේ තොරතුරු (ලිපිනය, දුරකථන අංකය ආදිය)	වත්කම්	භාර කතෘගේ නම/ සම්බන්ධ කර ගැනීමේ තොරතුරු	ප්‍රතිලාභීන් සියල්ලන්ගේ නම්	භාරය ආරක්ෂා කරන්නා/ කරන්නන්ගේ බලාත්මක කරන්නා/ කරන්නන්ගේ හෝ භාරකරු කෙරෙහි බලය ඇති වෙනත් තෙවන පාර්ශ්වයන්ගේ	අදාළ වන නීතිය

ආවරණය වන යම් තැනැත්තකු වෙනත් යම් තැනැත්තකු වෙනුවෙන් යම් දේපළක භාරකාරත්වය දරන්නේ ද? එසේ නම්, ඊට අදාළව ඉහත ඉල්ලා ඇති තොරතුරු සපයන්න.

දිවුරුම/ ප්‍රතිඥාව

.... වන මම මෙහි සපයා ඇති පිළිතුරු සහ සිදු කර ඇති ප්‍රකාශ සත්‍ය හා නිවැරදි බවත්, වෙනත් පාර්ශ්වයක කිසිදු බලපෑමකින් හෝ බල කිරීමකින් තොරව, මෙම වත්කම් සහ බැරකම් ප්‍රකාශ කිරීම සත්‍යවාදී ලෙස සිදු කළ බවත්, ගෞරව බහුමානයෙන් යුක්තව, අවංකව හා සත්‍ය ලෙස ප්‍රකාශ කර ප්‍රතිඥා දෙමි/ දිවුරුම් දෙමි.

ප්‍රකාශ නොකළ වත්කම් සහ/හෝ සාවද්‍ය ප්‍රකාශ පිළිබඳව අනාවරණය වුවහොත්, එහි නෛතික ප්‍රතිවිපාක පිළිබඳ මා මැනවින් දැනුවත්ව සිටිමි.

20 .... වර්ෂයේ .... මස .... දින මා ඉදිරිපිට දිවුරුම් / ප්‍රතිඥා දෙන ලදී.

දිවුරුම් කොමසාරිස්/ සාමදාන විනිශ්චයකාර

විස්තරාත්මක සටහන්

1) ඉල්ලා ඇති තොරතුරු සඳහන් කිරීම සඳහා මෙම ආකෘති පත්‍රයේ යම් තීරුවක ඉඩක ඩ ප්‍රමාණවත් නොවන්නේ නම්, එම තොරතුරු වෙනම උපලේඛනයක හෝ උපලේඛනවල දැක්විය හැකි අතර, එහි ප්‍රතිඵලයක් වශයෙන් ඊට ඇදෙන ඕනෑම උපලේඛනයක් සඳහා සුදුසු මූලාශ්‍ර දැක්වීම සිදු කරනු ලැබිය යුතු ය. එම උපලේඛන ඔබ විසින් ද අත්සන් කළ යුතුය.

2) මෙම ආකෘති පත්‍රයේ ඕනෑම කොටසක් තුල සටහන් කිරීමට තොරතුරු කිසිවක් නොමැති නම්, අදාළ ඉඩකඩ තුළ කරුණාකර “කිසිවක් නැත” යනුවෙන් ලියන්න.

3) වැඩිදුර පැහැදිලි කර ගැනීමේ කාර්යය සහා කරුණාකර 2023 අංක 9 දරණ දූෂණ විරෝධී පනතේ II වන කොටස බලන්න.

ඇමුණුම II

I	II
වත්කම් සහ බැරකම් ප්‍රකාශ ඉදිරිපත් කළයුතු තැනැත්තන්	**වත්කම් සහ බැරකම් ප්‍රකාශ භාරගතයුතු තැනැත්තන්**
(අ) ජනාධිපතිවරයා	අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාව
(ආ) අග්‍රාමාත්‍යවරයා, කැබිනට් අමාත්‍යවරු සහ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 45 වන ව්‍යවස්ථාව යටතේ පත් කරනු ලබන අමාත්‍යවරු	ජනාධිපතිවරයා
(ඇ) පාර්ලිමේන්තු මන්ත්‍රීවරු	කතානායකවරයා
(ඈ) පළාත් ආණ්ඩුකාරවරු	ජනාධිපතිවරයා
(ඉ) පළාත් සභා මන්ත්‍රීවරු සහ පළාත් රාජ්‍ය සේවයේ මාණ්ඩලික නිලධරයන්	• ආණ්ඩුකාරවරයා (පළාත් සභා මන්ත්‍රීවරුන්ගේ) • පළාත් සභා විෂය භාර අමාත්‍යාංශයේ ලේකම් (ප්‍රධාන ලේකම්) • ප්‍රධාන ලේකම් (මාණ්ඩලික නිලධරයන්ගේ)
(ඊ) පළාත් පාලන ආයතනවල තෝරා පත් කර ගනු ලැබූ සභිකයන් සහ මාණ්ඩලික නිලධරයන්	• පලාත් පාලන අමාත්‍යාංශයේ අමාත්‍යවරයා (පළාත් පාලන ආයතන වල සාමාජිකයන්) • පලාත් පාලන අමාත්‍යාංශයේ ලේකම් (නාගරික කොමසාරිස්, පළාත් පාලන ආයතන ලේකම්) • නාගරික කොමසාරිස් (නගර සභා සාමාජිකයන්ගේ, මාණ්ඩලික නිලධරයන්ගේ) • නගර සභා ලේකම් (නගර සභා මාණ්ඩලික නිලධරයන්) • ප්‍රාදේශීය සභා ලේකම් (ප්‍රාදේශීය සභා මාණ්ඩලික නිලධරයන්)
(උ) ජනාධිපතිවරයා විසින් පත් කරනු ලබන විනිසුරුවරුන් සහ රජයේ නිලධරයන්	ජනාධිපතිවරයා

(ඍ) අමාත්‍ය මණ්ඩලය විසින් පත් කරනු ලබන රජයේ නිලධරයන්	අදාළ ආයතන ප්‍රධානියා
(එ) අධිකරණ සේවා කොමිෂන් සභාව විසින් පත් කරනු ලබන අධිකරණ නිලධරයන් සහ ලේඛනගත රජයේ නිලධරයන්	අධිකරණ සේවා කොමිෂන් සභා ලේකම්
(ඒ) අමාත්‍යාංශවල සහ රජයේ දෙපාර්තමේන්තුවල මාණ්ඩලික නිලධරයන්	අදාළ ආයතන ප්‍රධානියා
(ඔ) පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන් නොවන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 41 අ (1) (ඉ) ව්‍යවස්ථාව ප්‍රකාරව පත් කරනු ලබන ලද ව්‍යවස්ථාදායක සභාවේ සාමාජිකයන්	ජනාධිපතිවරයා
(ඕ) ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 41 ආ ව්‍යවස්ථාවේ උපලේඛනයේ නිශ්චිතව දක්වා ඇති කොමිෂන් සභාවල අවස්ථාවෝචිත පරිදි, කොමිෂන් සභාවේ සභාපතිවරුන් හෝ සාමාජිකයන් ලෙස පත් කරනු ලබන තැනැත්තන්	ජනාධිපතිවරයා
(ක) ශ්‍රී ලංකා මහ බැංකුවේ සහ රාජ්‍ය බැංකුවල මාණ්ඩලික නිලධරයන්	මහ බැංකු අධිපති (මහ බැංකුවේ මාණ්ඩලික නිලධරයන්ගේ) ප්‍රධාන විධායක නිලධාරි / සාමාන්‍යාධිකාරී (බැංකු මාණ්ඩලික නිලධරයන්ගේ)
(ග) ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 41 අ (1) (ඇ) ව්‍යවස්ථාව යටතේ හෝ යම් ප්‍රඥප්තියක් යටතේ පිහිටුවන ලද ස්වාධීන කොමිෂන් සභාවල මාණ්ඩලික නිලධරයන්	අදාළ ආයතන ප්‍රධානියා
(ච) යම් ප්‍රඥප්තියක් මගින් හෝ ඒ යටතේ පිහිටුවන ලද ස්වාධීන නියාමන සහ අධීක්ෂණ කොමිෂන් සභාවල හෝ පුද්ගල මණ්ඩලවල සභාපතිවරු, කොමසාරිස්වරු, සාමාජිකයන් සහ මාණ්ඩලික නිලධරයන්	• පත්කිරීම් බලධාරියා (සභාපතිවරු, කොමසාරිස්වරු, සාමාජිකයන්) • ආයතන ප්‍රධානියා (මාණ්ඩලික නිලධරයන්)

(ජ) යම් ප්‍රඥප්තියක් මගින් හෝ ඒ යටතේ පිහිටුවන ලද යම් රාජ්‍ය සංස්ථාවක සභාපතිවරු, අධ්‍යක්ෂවරු, මණ්ඩලවල සාමාජිකයන්, විධායක නිලධරයන්	පත්කිරීම් බලධාරියා
(ට) පාර්ලිමේන්තුවේ මන්ත්‍රීවරුන්ගේ, පළාත් සභා මන්ත්‍රීවරුන්ගේ සහ පළාත් පාලන ආයතනවල සභිකයන්ගේ පුද්ගලික කාර්ය මණ්ඩල සාමාජිකයන්	පත්කිරීම් බලධාරියා
(ඩ) (357 වන අධිකාරය වූ) යුද්ධ හමුදා පනතේ විධිවිධානවලට අනුකූලව ඇති කොට පවත්වාගෙන යන ශ්‍රී ලංකා යුද්ධ හමුදාවේ නිලධරයන්	යුද්ධ හමුදාපතිවරයා
(ණ) (358 වන අධිකාරය වූ) නාවික හමුදා පනතේ විධිවිධාන වලට අනුකූලව ඇති කොට පවත්වාගෙන යන ශ්‍රී ලංකා නාවික හමුදාවේ නිලධරයන්	නාවික හමුදාපතිවරයා
(ත) (359 වන අධිකාරය වූ) ගුවන් හමුදා පනතේ විධිවිධාන වලට අනුකූලව ඇති කොට පවත්වාගෙන යන ශ්‍රී ලංකා ගුවන් හමුදාවේ නිලලත් නිලධරයන්	ගුවන් හමුදාපතිවරයා
(ද) 1981 අංක 15 දරන ජනාධිපතිවරයා තෝරාපත්කර ගැනීම පිළිබඳ පනත, 1981 අංක 1 දරන පාර්ලිමේන්තු මැතිවරණ පනත, 1988 අංක 2 දරන පළාත් සභා ඡන්ද විමසීම් පනත, (262 වන අධිකාරය වූ) පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් ආඥා පනත හෝ (138 වන අධිකාරය වූ) වෘත්තීය සමිති ආඥා පනතේ කාර්ය සඳහා වන පිළිගත් දේශපාලන පක්ෂවල තනතුරු දරන්නන්	මැතිවරණ කොමසාරිස්

(න) (138 වන අධිකාරිය වූ) වෘත්තීය සමිති ආඥා පනත යටතේ ලියාපදිංචි වී ඇති වෘත්තීය සමිතිවල විධායක නිලධරයන්	කම්කරු විෂයභාර අමාත්‍යාංශයේ ලේකම්
(ප) 1981 අංක 15 දරණ ජනාධිපතිවරයා තෝරාපත්කර ගැනීම පිළිබඳ පනත, 1981 අංක 1 දරණ පාර්ලිමේන්තු මැතිවරණ පනත, 1988 අංක 2 දරණ පළාත් සභා ඡන්ද විමසීම් පනත, (262 වන අධිකාරය වූ) පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් ආඥාපනත යටතේ පවත්වනු ලබන ඡන්ද විමසීමකදී තෝරා පත්කර ගැනීම සඳහා නම් කළ අපේක්ෂකයන්	මැතිවරණ කොමසාරිස්
(බ) රජය හෝ රජයේ සංස්ථාවක් විසින් සියයට විසිපහකට නොඅඩු කොටස් දරන්නා වූ 2007 අංක 07 දරන සමාගම් පනතේ විධිවිධාන යටතේ ලියාපදංචි කළ සමාගම්වල සභාපතිවරුන්, අධ්‍යක්ෂවරු සහ මාණ්ඩලික නිලධරයන්	සමාගම් රෙජිස්ට්‍රාර්
(ම) මේ පනතේ අර්ථානුකූලව උපලේඛනගත ආයතන වන්නා වූ මූල්‍ය ආයතනවල කලමනාකරණ හෝ අධීක්ෂණ කටයුතුවල නියැලෙන කාර්ය මණ්ඩලය	අදාළ ආයතන ප්‍රධානියා
(ය) ශ්‍රී ලංකාවේ රාජ්‍ය දූත මණ්ඩලවල ප්‍රධානීන්	ජනාධිපතිවරයා
(අඅ) අමාත්‍ය මණ්ඩලය විසින් ශ්‍රී ලංකා රාජ්‍ය දූත මණ්ඩලවලට පත්කළ නිලධරයන්	විදේශ කටයුතු අමාත්‍යාංශයේ ලේකම්
(ආආ) (180 වන අධිකාරය වූ) ප්‍රවෘත්ති පත්‍ර ආඥා පනතේ 2 වන වගන්තිය යටතේ ප්‍රකාශයක් කරනු ලැබ ඇති පුවත්පත්වල හිමිකරුවන්, කර්තෘවරුන් සහ කර්තෘ මණ්ඩලයේ සාමාජිකයන්	ජනමාධ්‍ය කටයුතු අමාත්‍යාංශයේ ලේකම්
(ඇඇ)1991 අංක 25 දරණ ශ්‍රී ලංකා විදුලි සංදේශ පනතේ 17 වන වගන්තිය යටතේ බලපත්‍රලාභී මාධ්‍ය සමාගම්වල හිමිකරුවන්, කර්තෘවරුන් සහ කර්තෘ මණ්ඩලයේ සාමාජිකයන්	විදුලි සංදේශ අමාත්‍යාංශයේ ලේකම්

(ඇඇ) ජාතික රාජ්‍ය සභාවේ 1973 අංක 25 දරන ක්‍රීඩා පනත ප්‍රකාරව පිහිටුවනු ලැබූ ජාතික ක්‍රීඩා සම්ගම්වල ධූර දරන නිලධරයන්	ක්‍රීඩා විෂයභාර අමාත්‍යාංශයේ ලේකම්
(ඉඉ) යම් නිලධරයන් ඔවුන්ට අදාළ යම් නිලයන්වල කටයුතු කිරීමේදී එම වැඩකටයුතුවල ස්වභාවයන් සැලකිල්ලට ගත්විට අල්ලස් හෝ දූෂණවලට පෙළඹීමට ඒ නිලධරයාට ඇති ඉඩකඩ සැලකිල්ලට ගනිමින් අධිඅවදනම් කාණ්ඩ ලෙස නියෝග මගින් නියම කරනු ලැබිය හැකි පරිදි වූ යම් වෙනත් නිලධාරී කාණ්ඩයන්	අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාව විසින් කලින් කලට නියම කරනු ලබන ආකාරයට

* යම් වෙනත් නීතියක් මගින් විශේෂිත විධි විධාන සලසා ඇති විට එකී විධි විධාන වලට අනුකූලව වත්කම් සහ බැරකම් ප්‍රකාශ ලබා දීම සිදු කළ යුතු ය.

ඇමුණුම III

<u>වත්කම් බැරකම් ප්‍රකාශ ලබා දීමට බැඳී සිටින අවස්ථාවන්</u>

01.	පළමු පත්වීම ලැබීමෙන් පසු	පත්වීමෙන් මාස 3ක් ඇතුළත
02.	පත්වීමෙන් අනතුරුව	වාර්ෂිකව
03.	විශ්‍රාම යාම හෝ ධූර කාලය අවසානයේ	දින 14 ක් ඇතුළත
04.	විශ්‍රාම යාමෙන් අනතුරුව	වාර්ෂිකව වසර 2ක්
05.	රුපියල් මිලියන දහයට වැඩි වත්කම් ලබා ගැනීමේදී	මාසයක් ඇතුළත
06.	මැතිවරණ අපේක්ෂකයන්	නාම යෝජනා පත්‍ර සමග

07. ඉහත 01–06 දක්වා ඇතුළත් නොවන පුද්ගලයන් වෙනත් නීති යටතේ වත්කම් බැරකම් ප්‍රකාශ කිරීමට දක්වා ඇති ප්‍රතිපාදනවලට අනුකූලව

82 වගන්තිය

(1) *මේ කොටස අදාළ වන සෑම තැනැත්තකු ම නියෝග මගින් කරනු ලැබිය හැකි යම් ආකෘතියකින් වත්කම් සහ බැරකම් ප්‍රකාශය—*

(අ) (මෙහි මින් මතු "පළමු පත්වීම් ප්‍රකාශය" යනුවෙන් සඳහන් කරනු ලබන) පත් කළ දින සිට මාස තුනක් තුළ;

(ආ) (මෙහි මින් මතු "වාර්ෂික ප්‍රකාශය" යනුවෙන් සඳහන් කරනු ලබන) (3) උපවගන්තිය ප්‍රකාරව වාර්ෂිකව;

(ඇ) (මෙහි මින් මතු "ධූර කාලය අවසානයේ දී හෝ විශ්‍රාම යාමේ දී සිදු කරනු ලබන ප්‍රකාශය" යනුවෙන් සඳහන් කරනු ලබන) අවස්ථාවෝචිත පරිදි, ඔහුගේ රැකියාවේ නිල කාලය අවසන් වීමේ දී හෝ ඔහුගේ විශ්‍රාම දිනයෙන් හෝ ඔහු ධූරයෙන් ඉවත් කළ දිනයෙන් ඉක්බිතිවම දින දාහතරක් තුළ;

(ඈ) (මෙහි මින් මතු "පශ්චාත් විශ්‍රාම ප්‍රකාශය" යනුවෙන් සඳහන් කරනු ලබන) (ඇ) ඡේදය යටතේ ප්‍රකාශය සිදු කළ වර්ෂයට අනුගාමී වර්ෂ දෙකක් තුළ;

(ඉ) (මෙහි මින් මතු "තත්කාර්ය ප්‍රකාශය" යනුවෙන් සඳහන් කරනු ලබන) රුපියල් මිලියන දහයක් හෝ රුපියල් මිලියන දහයකට වඩා වැඩි වත්කම් සහ බැරකම් පිළිබඳ වටිනාකමේ සුවිශේෂී වෙනස්කමක් සිදුවන අවස්ථාවක, ඒ සිදුවීමේ දින සිට මාසයක් ඇතුළත; සහ

(ඊ) අවස්ථාවෝචිත පරිදි, 1981 අංක 15 දරන ජනාධිපතිවරයා තෝරා පත් කර ගැනීම පිළිබඳ පනත, 1981 අංක 1 දරන පාර්ලිමේන්තු මැතිවරණ පනත, 1988 අංක 2 දරන පළාත් සභා ඡන්ද විමසීම් පනත හෝ (262 අධිකාරය වූ) පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් ආඥාපනත යටතේ, මැතිවරණ සඳහා නාම යෝජනා පත්‍ර ඉදිරිපත් කර ඇති විට දී, සිදු කළ යුතු ය.

(2) යම් තැනැත්තකු නියම කළ දිනයේ දී මේ කොටස අදාළ නොවන තැනැත්තකු වන අවස්ථාවක දී, මේ කොටස අදාළ වන තැනැත්තකු බවට ඔහු පත්වන දින සිට මාස තුනක් ඇතුළත ඔහු විසින් මේ කොටස අදාළ වන තැනැත්තකු බවට ඔහු පත්වන දිනට ඔහුගේ වත්කම් හා බැරකම් ප්‍රකාශයක් සිදු කළ යුතු ය:

එසේ වුව ද, 80 වගන්තියේ (1) උපවගන්තියේ (ප) ඡේදයේ සඳහන් පරිදි, මේ කොටස අදාළ වන යම් තැනැත්තකු විසින්, ඡන්ද විමසීම පිළිබඳ දිනය ප්‍රකාශ කරනු ලබන අදාළ නීතිය යටතේ, ප්‍රකාශය සිදු කරනු ලබන දිනය දක්වා වන කාලසීමාව සඳහා ඔහුගේ ප්‍රකාශය ඉදිරිපත් කළ යුතු ය.

(3) (1) වන හෝ (2) වන උපවගන්ති යටතේ වත්කම් සහ බැරකම්වල පළමු ප්‍රකාශය භාරදීමට නියම කර ඇති සෑම තැනැත්තකු ම, මේ කොටස අදාළ වන තැනැත්තකු බවට ඔහු පත්වීම අවසන් වී ඇත්නම් මිස එක් එක් වර්ෂයේ ජූනි මස තිස්වන දින වන විට ඒ වර්ෂයේ මාර්තු මස තිස් එක් වන දිනට ඔහුගේ වත්කම් සහ බැරකම්වල ප්‍රකාශයක් නියෝග මගින් නියම කරනු ලැබිය හැකි ආකෘතියෙන් සිදු කළ යුතු අතර, මේ කොටස යටතේ ඔහුගේ වත්කම් සහ බැරකම්වල ප්‍රකාශයක් සිදු කිරීමට පළමුව ඔහුට නියම කළ දිනයේ ඔහු විසින් දැරූ වත්කම් සහ බැරකම් ඒ ප්‍රකාශයේ ඇතුළත් කළ යුතු ය:

එසේ වුව ද, (2) වන උපවගන්තිය යටතේ වත්කම් සහ බැරකම් ප්‍රකාශයක් සිදු කිරීමට නියම කර ඇති තැනැත්තකු විසින් යම් වර්ෂයක් තුළ මාර්තු මස තිස්එක් වන දිනයට පෙරාතුව මාස හයක් තුළ යම් දිනයක දී පළමු ප්‍රකාශය සිදු කර ඇති අවස්ථාවක දී, (1) වන උපවගන්තියේ (ඉ) ඡේදයේ සඳහන් කරන ලද සුවිශේෂී වෙනසක් ඔහුගේ වත්කම් සහ බැරකම්වල පවතින අවස්ථාවක ඒ සඳහා වන තත්කාර්ය ප්‍රකාශයක් හැර වෙනත් ප්‍රකාශයක් ඒ වර්ෂය සඳහා ඉදිරිපත් කරන ලෙසට ඔහුට නියම නොකළ යුතු ය.

<u>උපදෙස් පත්‍රිකාව</u>

01. ඔබ ආයතනය සහ ඔබ ආයතනය යටතේ අනු ආයතන පවතී නම්, එම ආයතන වලද සේවය කරන 2025 වර්ෂයට අදාළව **<u>වාර්ෂිකව</u> වත්කම් සහ බැරකම් ප්‍රකාශ ලබාදිය යුතු නිලධාරීන්ගෙන්**, ඔවුන්ගේ වත්කම් සහ බැරකම් ප්‍රකාශ, මෙහි **ඇමුණුම II** හි සඳහන් පරිදි 2025.06.30 දින හෝ ඊට ප්‍රථමව කැඳවා ආයතන ප්‍රධානියා විසින් භාර ගත යුතුය.

02. වත්කම් සහ බැරකම් ප්‍රකාශ, ලිපි කවරයක බහා මුද්‍රා තබා වම් පස උඩ කෙළවර **"රහස්‍ය" - වත්කම් සහ බැරකම් ප්‍රකාශ අංශය - CIABOC** යනුවෙන් සඳහන් කර වත්කම් සහ බැරකම් ප්‍රකාශ සිදු කරන්නාගේ නම ලිපි කවරයේ මුහුණතෙහි සඳහන් කර **ඇමුණුම II** හි සඳහන් පරිදි අදාළ ආයතන ප්‍රධානීන් වෙත ලබා දීමට කටයුතු කරන ලෙස වත්කම් සහ බැරකම් ප්‍රකාශ ලබාදිය යුතු තැනැත්තන්ව ආයතන ප්‍රධානියා විසින් දැනුවත් කළ යුතුය.

03. එසේ සුරක්ෂිත අයුරින් භාරගත් වත්කම් සහ බැරකම් ප්‍රකාශ, භාරගත් දිනය සහිතව ආයතන ප්‍රධානියා යටතේ ඇති වත්කම් සහ බැරකම් ප්‍රකාශ සම්බන්ධ තොරතුරු දත්ත පද්ධතියක හෝ නාම ලේඛනයක සටහන් කර ආයතන ප්‍රධානියා විසින් පවත්වා ගෙන යා යුතු වේ. මේ සම්බන්ධයෙන් කොමිෂන් සභාව විසින් තොරතුරු විමසන ඕනෑම අවස්ථාවකදී තොරතුරු ලබා දීමට අවශ්‍ය කටයුතුද ආයතන ප්‍රධානියා විසින් සිදු කරන මෙන් දන්වා සිටිමි.

04. ඉන්පසු සියලුම ප්‍රකාශ සුරක්ෂිතව **2025.07.07 දින හෝ ඊට ප්‍රථමව** අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාවේ **වත්කම් සහ බැරකම් ප්‍රකාශ අංශයට <u>පැමිණ</u>** හෝ **<u>කුරියර් මගින්</u>** හෝ **<u>ලියාපදිංචි තැපෑල</u>** ක්‍රමයට හෝ **එවීමට ආයතන ප්‍රධානියා විසින් කටයුතු කළ යුතුය.**

05. වත්කම් සහ බැරකම් ප්‍රකාශ කිරීම සම්බන්ධ ලේඛන පහතින් දක්වා ඇත.

5.1. වත්කම් සහ බැරකම් ප්‍රකාශ කිරීම පිළිබඳ ක්‍රමවේදය ඇතුළත් 2025 වර්ෂයට අදාළ **චක්‍රලේඛය**
5.2. වත්කම් සහ බැරකම් ප්‍රකාශ ආකෘතිය **(ඇමුණුම I)**
[ඇමුණුම I - මෙම ආකෘතිය අපගේ නිල වෙබ් අඩවියෙන් ලබා ගත හැක.]
5.3. වත්කම් සහ බැරකම් ප්‍රකාශ භාර ගත යුතු තැනැත්තන් සඳහන් ලේඛනය **(ඇමුණුම II)**
5.4. වත්කම් සහ බැරකම් ප්‍රකාශ ලබා දීමට බැඳී සිටින අවස්ථාවන් ඇතුළත් ලේඛනය **(ඇමුණුම III)**

ඉහත චක්‍රලේඛය සහ අදාළ ඇමුණුම් භාෂා ත්‍රිත්වයෙන් අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාවේ නිල වෙබ් අඩවිය **<u>(www.ciaboc.gov.lk)</u>** මගින් ද බාගත කර ගත හැක.

තවදුරටත් වත්කම් සහ බැරකම් ප්‍රකාශ සම්පූර්ණ කිරීමේ **මාර්ගෝපදේශය** අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාවේ නිල වෙබ් අඩවියෙන් ඔබගේ පරිශීලනය සඳහා ලබා ගත හැක.

06. මේ සමඟ ඔබ ආයතනය සහ ඔබ ආයතනය යටතේ අනු ආයතන පවතී නම්, එම ආයතන වලද වාර්ෂිකව වත්කම් සහ බැරකම් ප්‍රකාශ ලබාදිය යුතු නිලධාරීන්ගේ තොරතුරු පහත ආකෘතීන් පරිදි සම්පූර්ණ කර එවන මෙන් දන්වා සිටිමි.

<u>ආකෘතිය 01</u>

අනු අංකය	විස්තරය	සංඛ්‍යාව
01.	ආයතනයේ මුළු නිලධාරීන් සංඛ්‍යාව	
02.	වාර්ෂිකව වත්කම් සහ බැරකම් ප්‍රකාශ ලබාදිය යුතු නිලධාරීන් සංඛ්‍යාව	
03.	2025.06.30 දින හෝ ඊට ප්‍රථමව වත්කම් සහ බැරකම් ප්‍රකාශ ලබා දුන් නිලධාරීන් සංඛ්‍යාව	
04.	2025.06.30 දින වන විට වත්කම් සහ බැරකම් ප්‍රකාශ ලබා නොදුන් නිලධාරීන් සංඛ්‍යාව	

ආකෘතිය 01ට අදාළ තොරතුරු සහ 2025.03.31 දිනට අදාළව 2025.06.30 දිනට වාර්ෂික වත්කම් සහ බැරකම් ප්‍රකාශ ලබා දුන් හා ලබා නොදුන් නිලධාරීන්ගේ නම් ඇතුළත් නාම ලේඛනයක මෘදු පිටපත් වෙන් වෙන් වශයෙන් 2025.07.07 දින හෝ ඊට ප්‍රථමව MS Excel මඟින් (PDF නොකර) ඉංග්‍රීසි භාෂාවෙන් **assets@ciaboc.gov.lk** ඊමේල් ලිපිනය වෙත යොමු කරන ලෙස මෙයින් දන්වා සිටිමි. මෙහි දෘඪ පිටපත්ද වත්කම් සහ බැරකම් ප්‍රකාශ කොමිෂන් සභාවට එවන විට ඒ සමඟ එවීමට කාරුණික වන්න.

<u>ආකෘතිය 02</u>

Serial No.	Recipients of the Declaration	Full Name	Designation	Institution	NIC	TIN	Mobile Number	Email

මීට අමතරව, ආකෘතිය 02හි මෘදු පිටපතක් 2025.05.30 දින හෝ ඊට ප්‍රථමව MS Excel මඟින් (PDF නොකර) ඉංග්‍රීසි භාෂාවෙන් **assets@ciaboc.gov.lk** ඊමේල් ලිපිනය වෙත යොමු කරන ලෙස මෙයින් දන්වා සිටිමි. මෙහි දෘඪ පිටපතක් වත්කම් සහ බැරකම් ප්‍රකාශ කොමිෂන් සභාවට එවන විට ඒ සමඟ එවීමට කාරුණික වන්න.

07. ඔබ ආයතනය සහ ඔබ ආයතනය යටතේ අනු ආයතන පවතී නම්, එම ආයතනද ඍජුව සම්බන්ධ කර ගැනීමට හැකි වන පරිදි සුදුසු සම්බන්ධීකරණ නිලධාරියකු (මාණ්ඩලික හෝ තීරණගත හැකි මට්ටමේ සිටින නිලධාරියකු) නම් කර, එම නිලධාරියාගේ සියලු විස්තරද පහත ආකෘතිය ප්‍රකාරව ලබා දීමට අවශ්‍ය කටයුතු සිදු කරන මෙන් වැඩිදුරටත් ඔබට මෙයින් දන්වා සිටිමි.

ආයතනයේ නම	නම් කළ නිලධාරියාගේ නම	නිත්‍ය තනතුර	දුරකථන අංකය		විද්‍යුත් තැපැල් ලිපිනය	ෆැක්ස් අංකය
			ජංගම	ස්ථාවර		

08. ඉහත තොරතුරු සහ ඔබ ආයතනය යටතේ ක්‍රියාත්මක වන අනු ආයතන පවතී නම්, එම ආයතනවල නිවැරදි ලිපිනයන් හා දුරකථන අංක ද සඳහන් කරන ලද ලේඛනයක් "අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාව, අංක 36, මලලසේකර මාවත, කොළඹ 07." යන ලිපිනයට එවීමට කාරුණික වන්න.